සාපේක්ෂ දිළිඳුකම යනු සෘජුවම හඳුනාගත නොහැකි සංකල්පයක් වන අතර, ලෝක බැංකුව නිර්වචනය කරන්නේ කිසියම් රටක මධ්‍යම ආදායම් මට්ටමට සාපේක්ෂව එක් එක් පුද්ගලයන් හෝ කුටුම්බ හෝ, හිමි කර ගන්නා ආදායම් මට්ටම් තුලනාත්මකව විග්‍රහ කිරීමයි (අතපත්තු, 2011, පි. 451). ඒ අනුව යම්කිසි කාලයකදී හෝ ස්ථානයකදී දුගීකම වශයෙන් පිළිගන්නා වූ ජීවන මට්ටම් තවත් ස්ථානයකදී හෝ කාලකවානුක දී වෙනස් වියහැකි බව සාපේක්ෂ දුගීකම පිළිබඳ න්‍යායෙන් විග්‍රහ කරයි (පෙරේරා, 2016, පි. 6). නිරපේක්ෂ දිළිඳුකම යනු අපට සෘජුවම හඳුනාගත හැකි සංකල්පයක් වන අතර රැකියාවක් හෝ ආදායම් මගක් නොවීම, පෝෂ්‍යදායක ආහාර නොලැබීම, ජීවත්වීමට ස්ථීර වාසස්ථානයක් නොවීම මෙහිදී සැලකිය හැක (අමරසේකර, 1988, පි. 128). මෙය සෞඛ්‍ය හා ශාරීරික වශයෙන් කාර්යක්ෂමභාවය රඳා පැවැත්ම සඳහා අවශ්‍ය නොයෙකුත් මූලික මානව අවශ්‍යතාවන් ඇසුරින් ගොඩනඟා ඇති සංකල්පයකි.

අපු චිත්‍රපට ත්‍රිත්වය
පෙරදිග ආසියාතික සිනමා අධ්‍යක්ෂකවරයකු වන සත්‍යජිත් රායි සිනමාකරුවකු පමණක් නොව චිත්‍ර ශිල්පියෙකුද වන්නේය. සත්‍යජිත් රායි බ්‍රිතාන්‍ය යටත්විජිතවාදී පසුබිමක හැදී වැඩුණ අතර බෙංගාලි සංස්කෘතිය නිරූපණය කරමින් ඔහුගේ සිනමා කෘති නිර්මාණය කරන්නට විය. උසස් අධ්‍යාපනයෙන් අනතුරුව ශාන්ති නිකේතනය වෙත ඇතුළත් වන රායි එහිදී චිත්‍ර ශිල්පය ප්‍රගුණ කරන ලදී. ශාන්ති නිකේතනයේදී රායි ලැබූ අධ්‍යාපනය ඔහුට බෙංගාලි ජන දිවියේ රිද්මය විනිවිද දැකින්නට අවැසි බුද්ධිය වර්ධනය කර ගැනීමට මහත්සේ මහෝපකාරී විය. රායිගේ සිනමා දිවියේ මූලික අධිතාලම ශාන්තිනි නිකේතනයෙන් ලබා ගත් බව මෙහිදී පැහැදිලි වේ. ශාන්ති නිකේතනයෙන් ලද අධ්‍යාපනයෙන් ඉක්බිතිව 1943 දී ක්‍රේමර් නැමැති ප්‍රචාරක ආයතනයට බැඳි එහි සහාය සැලසුම් චිත්‍ර ශිල්පියකු ලෙස සේවය කළේය (*Dawasin Dawasata: පාතර් පංචාලි (Song of the Little Road)*, 2015). පසුව ඔහු එහි නිර්මාණ අංශයේ විධායක අධ්‍යක්ෂවරයා බවට පත්වීමට සමත් විය. 1950 දී ලන්ඩන් නගරයේ පිහිටි ප්‍රධාන කාර්යාලයට ඔහුට මාරුවක් ලැබුණි. ඒ මාස තුනක් වැනි කෙටි කාලයක් සඳහා ය. මෙම කෙටි කාලය තුළ ඔහු ලෝකයේ නිර්මාණය වූ ශ්‍රේෂ්ඨ සිනමා කෘති නැරඹීමද අමතක නොකළේය. ඉතාලි ජාතික මහා සිනමාකරුවකු වූ විටෝරියෝ. ඩී. සිකා විසින් නිර්මාණය කරන ලද *බයිසිකල්*

නීව්ස් (Bicycle Thives) (1948) නැමැති චිත්‍රපටය නැරඹීමෙන් ඔහු සිනමා නිර්මාණයට යොමු වූ බව පසු කලෙක ඔහු විසින් පුවත්පත් සම්මුඛ සාකච්ඡාවකදී පවසන ලදී. රායිගේ සිනමා ජීවිතයට මුලකරු කියවෙන්නේ සිනමා පාසලකින් නොවේ. සිය පියා කුඩා කලම මියයාම නිසා නිවසේ තනි වන විටක ඔහු ලෝකය හා ගනුදෙනු කරන්නේ සිය නිවසේ තිබූ කුඩා සිදුරකින් මාවතේ ගමන් කරන මිනිසුන් දෙස විදුරු කැබැල්ලක් ආධාරයෙන් බලමින්. බිත්තියේ සිදුරකින් තමා දකින, මාවතේ ගමන් කරන මිනිසුන්ගේ රූප දෙස හා එහි චලන, ඒ මත වැටෙන විවිධ ආලෝක කඳම්බයන්, පසුබිමින් ඇසෙන ස්වභාවික නාදයන් දකින්නට සහ අසන්නට තමා පැය ගණන් බිත්ති සිදුර ළඟ සිටි බව රායි පවසන්නේ සිය බාල වියේ මතක අවදි කරමිනි. එම රූපයන් සත්‍යජිත් රායිගේ ප්‍රථම චිත්‍රපටය වන පාතර් පංචාලි හිදී හමුවේ. දුර්ගා තම මළණුවන් වන අපූ දෙස බිත්ති සිදුරකින් බලන දර්ශනයද, චාරුලතා චිත්‍රපටයේ චාරුලතා තම තනිකම මකා ගැනීමට මහා මන්දිරයේ කුඩා කවුළුවකින් එබී බලන දර්ශනයද මෙයට උදාහරණ සේ ගත හැක.

සත්‍යජිත් රායිගේ අපූ තිත්වය ඉතාමත් පුළුල් ලෙසත්, සර්වව්‍යාපී ලෙසත්, සිනමා සංඥා රැසක් යොදා ගනිමින් බෙංගාලි සංස්කෘතියේ බහුවිධ අර්ථ කියවීමට සැලැස්වූ සිනමා කෘති තිත්වයකි. සත්‍යජිත් රායි විසින් ඔහුගේ සිනමා කෘති සඳහා එකල බෙංගාලයේ පැවති සමාජීය පසුබිම සුක්ෂම අයුරින් ඇතුළත් කර ඇත. සත්‍යජිත් රායි උපන් වර්ෂය වූ 1921 වන විට ඉන්දියාව බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් වූ අතර, දුප්පත්කම අතින් ඉහළ ස්ථානයක සිටියේය. විශේෂයෙන්ම නාගරික ප්‍රදේශවලට වඩා ග්‍රාමීය ප්‍රදේශවල මෙම දිරිතාවය සමාජ ප්‍රශ්නයක් ලෙස වර්ධනය විය. අපූ තිත්වය යන සිනමා කෘතීන් බිහි වන්නේ මෙම කාලයේදීය.

අපූ තිත්වයෙහි එන පළමු සිනමා කෘතිය වන්නේ පාතර් පංචාලිය. බිහුපතිභූෂන් නම් අපුකට සාහිත්‍යකරුවා විසින් රචනා කරන ලද පොතේර් පංචාලි නම් කෘතිය ආශ්‍රය කොට ගෙන පාතර් පංචාලි සිනමා කෘතිය සත්‍යජිත් රායි විසින් නිර්මාණය කරන ලදී. පොතේර් පංචාලි යන්නෙහි ඉංග්‍රීසි තේරුම වන්නේ Song of the Little Road යන්නයි. එය චින්තා ලක්ෂ්මී සිංහආරච්චි මහත්මිය විසින් මාවතේ ගීතය ලෙස සිංහල කෘතියකට පරිවර්තනය කර ඇත.

පාතර් පංචාලි සිනමා කෘතියෙන් බෙංගාලයේ ගම්මානයක ජීවන බරින් මිරිකී වෙසෙන අඹුසැමි යුවළකගේ කුටුම්භය පෙන්නුම් කරයි. ඔවුන් බෙංගාල දේශයේ ජීවත් වූ බ්‍රාහ්මණ පවුලකි. තම පවුල නඩත්තුවට ප්‍රමාණවත් ආදායමක් නොලබන කවියෙකු වූ දිළිඳු බ්‍රාහ්මණ පූජකයා වන හරිහර් මේ පවුලේ ප්‍රධානියා විය. මෙම චිත්‍රපටයෙන් දරිද්‍රතාව, ආදරය, ස්වභාවධර්මය, මරණය හා ජීවත්වීමේ අරගලය පෙන්වයි. දරිද්‍රතාව හා ජීවන අරගලය හරිහර්, දුර්ගා හා අපූගෙන් පෙන්වා දෙයි. හරිහර් බුද්ධිමතෙකු හා කවියෙකු යයිද, දුර්ගා දැඩි සංවේදී බවකින් යුත් අහිංසක දැරියක කියාද, මෙහිදී හඳුනාගත හැක. එමෙන්ම ඔවුහු අපේ ම කොටසක් බවට පත්වී, අපේ අභ්‍යන්තරයේ ඇති යම් දෙයක් ද මනුෂ්‍යත්වය පිළිබඳ දෘෂ්ටියද වෙනස් කරති (Thushi, 2017).

පාතර් පංචාලි ලෝකයේ වැඩිම සම්මාන සංඛ්‍යාවක් හිමිකරගත් සිනමා කෘතියකි. බෙංගාලි භාෂාවෙන් නිර්මාණය කරන ලද මෙම චිත්‍රපටය එවකට ලෝකයේ වැඩිම පිරිසක් නැරඹූ හා වැඩිම සම්මාන ප්‍රමාණයක් හිමි කරගත් ඉන්දීය චිත්‍රපටයයි (Thushi, 2017). තම පවුලේ නඩත්තුවට ප්‍රමාණවත් තරම් ආදායමක් නොලැබෙන කවියෙකු වූ දිළිඳු බ්‍රාහ්මණ පූජකයා වන හරිහර් මෙම පවුලේ මූලිකයාය. දෛනික දුක්කන්දරාවක් උසුලාගෙන දිවි ගෙවන හරිහර්ගේ බිරිඳ සර්බෝජ්‍යා දාර්ශිය ඉන්දියානු ගැහැණියකි. දියණිය දුර්ගා කෙළිලොල් දැරියකි. නිවසේ වෙසෙන මහළු මිත්තණිය ජීවිතයේ සැඳෑ සමය ගෙවමින් සිටින්නීය. ඈත සර්බෝජ්‍යාත් අතර නිරන්තර ගැටුම් හටගනී. මෙම සිනමා කෘති තිත්වයේම කේන්ද්‍රීය චරිතය වන්නේ අපූය. එම පවුලේ එකම පිරිමි දරුවා වන ඔහු හයවන වියට එළඹෙන විට ගමේ වෙළෙන්දෙකු පවත්වාගෙන යන අඩු ලුහුඩුකම් එමට ඇති පාසලක් නොවූ පාසලක අධ්‍යාපනය ලබයි. මෙසේ බාල වියේ පටන් පරිණත වැඩිහිටියෙකු දක්වා වූ අපූගේ ජීවිතයේ නොයෙකුත් භාව විද්‍යාත්මක හා කැළඹිලි තුළින් රායි ඔහුගේ ජීවිතය සිනමාරූපිකව ගෙන එන බව චිත්‍රපටය විමර්ශනයේදී පැහැදිලි වේ. කළු සුදු චිත්‍රපටයක් වන පාතර් පංචාලි මඟින් එකල බෙංගාලි සමාජයේ පවත්නා වූ දරිද්‍රතාවයද පෙන්නුම් කරයි.

මෙම චිත්‍රපටයේ ආරම්භක දර්ශනය අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ දුර්ගා පළතුරු සොරකම් කරන දර්ශනයකි. දරිද්‍රතාවයේ එන ප්‍රධාන ලක්ෂණයක් වන ආහාර හිඟකම මෙම ආරම්භක දර්ශනයෙන් මනාව පෙන්වයි. එමෙන්ම මෙම දර්ශනයේ ඔවුන්ගේ නිවස ගරා වැටීමට ආසන්න නිවසක් බව පෙනීයයි. එයද දරිද්‍රතාවය මෙහිදී පෙන්වා ඇති බවට නිදසුනකි.

එමෙන්ම ඔවුන්ගේ නිවස අනෙකුත් නිවාසයන්ගෙන් හුදකලාව පවතී. ඔවුන්ගේ නිවසට යාබදව මිත්තණියගේ නිවස ද පවතින අතර එම නිවාස දෙකම ගරා වැටීමට ආසන්න තත්ත්වයේ පවතී. නිවස තුළ පවතින්නේ එක ඇඳක් වන අතර එම ඇඳ බෙදා හදා ගනිමින් පවුලේ සියල්ලන්ම නින්දට යයි. එයද දරිද්‍රතාව පෙන්වන එක

සාධකයක් බව මෙහිදී පෙන්වා දිය හැක. එමෙන්ම කාන්තාවන්ගේ පෞද්ගලිකත්වය අහිමිවීම මෙම දරිද්‍රතා පවුල් වල තිබෙන ලක්ෂණයක් බව මෙම චිත්‍රපටය මගින් පෙන්වා දෙයි. නමුත් එක ඇඳක් බෙදා හදා ගනිමින් නින්දට යාම මගින් පවුලේ සමගිය හා එකමුතුකම මෙහිදී නිරූපණය කළ ඇති බව වැඩිදුරටත් පෙන්වාදිය හැක.

එමෙන්ම තවත් එක් දර්ශනයක සර්හෝජ්‍යාත් විසින් තමන්ගේ ස්වාමියා වන හරිහර් ගෙන් පවුලට අවශ්‍ය ආහාරපාන මිලදී ගැනීම සඳහා අදමින් මුදල් ඉල්ලන දර්ශනයද මෙම පවුලේ දරිද්‍රතා මට්ටම විදහා දක්වන බව අධ්‍යයනයේදී පෙනී යයි. තවද දුර්ගා අසනීප වූ විට ඇයට අවශ්‍ය අවම වෛද්‍ය පහසුකම් ලබා නොදීම නිසා ඇය මිය යාමද මෙම චිත්‍රපටයේ එන බේදනීය දසුනකි. මිනිසෙකු ජීවත් වීමට අවශ්‍ය මූලික අවශ්‍යතා ලෙස ආහාරපාන, ඇඳුම් පැළඳුම් හා බෙහෙත් අවශ්‍ය වුවත්, මෙම චිත්‍රපටය මගින් පෙනී යන්නේ අධික දරිද්‍රතාවයෙන් පෙළෙන පවුල් වලට මෙම අවම මූලික අවශ්‍යතාවත් සපුරා ගැනීමට නොහැකි බවයි. එමෙන්ම මෙම චිත්‍රපටය මගින් රොබට් වෙම්බස් විසින් දක්වන ලද දරිද්‍රතාවයේ පැතිකඩවල් පහ නිරූපණය කරයි. එනම් හරිහර් පමණක් පවුලේ එකම ආදායම උපයන්නා වීම මගින් ආදායම තත්ත්වය පහළ යාමත්, පවුලේ සියල්ලන්ටම හරිහැටි ආහාරයක් නොමැතිව කායිකව දුබල වීමත්, එමගින් පීඩනයන්ට ගොදුරු වීමේ නැඹුරුතාවයක් දැක්වීමත්, සියල්ලන්ගෙන්ම හුදෙකලාව වාසය කිරීමත් මෙම චිත්‍රපටය මගින් නිරූපණය කර ඇත. එමෙන්ම අධ්‍යාපන තත්ත්වය දුර්වල වීම ද, සෞඛ්‍ය තත්ත්වය පිරිහීම ද, ආදී ප්‍රධාන ජීවන දර්ශකයන් තුළින් මෙම චිත්‍රපටයෙහි පෙන්වා දෙන දුගීකම අවබෝධ කරගත හැකිය.

සත්‍යජිත් රායිගේ අති සාර්ථක පාතර් පංචාලි චිත්‍රපටයෙන් පසුව එම චිත්‍රපට මාලාවේ දෙවන කොටස ලෙස අපරාජිතයෝ 1956 දී තිරගත විය. අපුගේ සොහොයුරිය වන දුර්ගාගේ මරණයෙන් පසු ගම හැරදා යන තැනින් අවසන් වූ කතාව අපරාජිතයෝ චිත්‍රපටය ලෙසින් එතැන් සිට ඉදිරිපත් කරයි. අපරාජිතයෝ චිත්‍රපටය මගින් පෙනී යන්නේ ඔවුන් තවදුරටත් දරිද්‍රතාවයෙන් පෙළෙන බවයි. අපුගේ පියා මියගිය පසු ඔහු තම මව සමග ආපසු බෙංගාලයේ ගමක පදිංචියට පැමිණෙයි. දරිද්‍රතාවයෙන් පෙලුනත් විධිමත් අධ්‍යාපනයක් ලබා අපු දක්ෂ සිසුවෙකු බවට පත්වෙයි. අධ්‍යාපනය ලැබීමත් සමග වයසින් හා අදහස් වලින් මුහුකුරා ගිය අපු වරින් වර ඔහුගේ මව සමග ගැටුම් ඇති කරගනියි. අවසානයේ මවගේ මරණයත් සමග ඔහු තනියම ජීවත් වීමට ඉගෙන ගැනීමට සුදානම් විය යුතුය. මෙම චිත්‍රපටය මගින් මව් සෙනෙහසක ඇති අසීමිත බව හා බෙංගාලි සමාජයේ එවකට පවතින දරිද්‍රතාව ඉතාමත් සියුම්ව ආකාරයෙන් නිරූපණය කරයි. එමෙන්ම ගැහැණියක් ලෙස විවිධ දරාගන්නා දුක්කම්කතොළ හා ඇගේ සිතුවිලි රවිෂන්කර්ගේ අපූර්ව සංගීතයෙන් ඉදිරිපත් කර ඇත.

ග්‍රාමීය සමාජයේ ඇති වැරිච්චි බිත්ති සහිත ගෙවල්ද, පොල් අතු සෙවිලි කළ වහලවල්ද මගින් පෙනී යන්නේ එවකට පැවැති බෙංගාලි සමාජයේ ඇති දරිද්‍රතාවයයි. එමගින් දරිද්‍රතාවයේ එක් අන්තර්ගත ලක්ෂණයක් වන අයහපත් නිවාස පෙන්නුම් කරයි. එමෙන්ම එක් දර්ශනයක වහලය හරහා වැසි වතුර අපුගේ පොත් වලට වැටේ. මෙමගින් සිනමාකරුවා අදහස් කරන්නේ අධ්‍යාපනය තුළින් ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීමට දරන උත්සාහයට දරිද්‍රතාවය තර්ජනයක් වන බවයි.

අපු ත්‍රිත්වයේ අවසාන චිත්‍රපටය ලෙසින් නිමවූ අපුර් සංසාර් චිත්‍රපටය සත්‍යජිත් රායිගේ සිනමා ජීවිතයේ තවත් කඩ ඉමක් සටහන් කරන්නකි. සිය මවගේ මරණයෙන් පසුව කල්කටාවේ තනිවන අපු රැකියාවක් නොමැතිකම නිසා දුක් විදින්නට පටන් ගනියි. ඒ අනුව මෙම විරැකියාව දරිද්‍රතාවයේ එක් ලක්ෂණයක් ලෙස ද සැලකිය හැක. රැකියාවක් නොමැතිවීමෙන් සිදුවන්නේ ආදායම අහිමිවීමයි. එවිට දිනක ආහාර වේලක අඩංගු අවම කැලරි ප්‍රමාණය ලබා ගැනීමට එම දරිද්‍රතාවයෙන් පෙළෙන අයවලුන්ට නොහැකි වෙයි. එවිට එම පිරිස් කායික දුබල වෙයි.

අපුට තවදුරටත් ඉගෙනීමට අවශ්‍ය වුවත්, ඔහුට මිල මුදල් නොමැතිකම නිසා කල්කටාවේ විවිධ රැකියා සොයන්නට වෙයි. කල්කටාවේ තනිවන අපු දිනක් තම මිතුරෙකුගේ ඇරයුමෙන් ඈත ගමක තරුණියකගේ විවාහ මංගල උත්සවයකට යයි. අනපේක්ෂිත ලෙස විවාහයේදී අතහැර දැමූ මනාලිය වූ අපර්ණාව ඔහු තම කුටියට කැඳවාගෙන එයි. එය පෙන්වන දර්ශනයේදී අපුගේ කුටිය අවම පහසුකම් වලින් යුක්ත විය. මෙය ද දරිද්‍රතාවයේ එක් ප්‍රධාන ලක්ෂණයක් ලෙස සැලකිය හැක. එමෙන්ම දරු ප්‍රසුතියේදී අපර්ණා මිය යන අතර ඉන් මානසික කම්පාවට පත්වන අපු සිය බිළිඳු පුත් අතහැර ඉන්දියාව පුරා ඇවිදිමින් ගමනාන්තයක් සොයයි. දරු ප්‍රසුතියකදී මව මිය යන්නේ අවම සෞඛ්‍ය පහසුකම් තත්ත්වයක් නිසාය. අවම සෞඛ්‍ය පහසුකම් තත්ත්වයක් සහිත වීමද දරිද්‍රතාවයේ එක් ප්‍රධාන ලක්ෂණයක් ලෙස සැලකිය හැක.

ඉහත චිත්‍රපට කිහිපයේ දර්ශන කිහිපයක් මගින් දරිද්‍රතා ලක්ෂණ පෙන්වා දෙන බව පහත පරිදි පෙන්වා දිය හැක.

චිත්‍රපටයේ නම	දර්ශනය	දරිද්‍රතාවය විග්‍රහ කරන ලක්ෂණය
පාතර් පංචාලි	දුර්ගා පළතුරු සොරකම් කිරීම	පෝෂදායක ආහාර නොලැබීම
පාතර් පංචාලි	නිවාස දෙකම ගරා වැටීමට ආසන්න තත්ත්වයේ පැවතීම	ජීවත්වීමට ස්ථීර වාසස්ථානයක් නොවීම
පාතර් පංචාලි	නිවස තුළ පවතින්නේ එක් ඇඳක් පැවතීම	පෞද්ගලිකත්වයක් නොමැති වීම
පාතර් පංචාලි	සර්හෝජ්‍යා විසින් හරිහර් ගෙන් පවුලට අවශ්‍ය ආහාරපාන මිලදී ගැනීම සඳහා අඩමින් මුදල් ඉල්ලන දර්ශනය	ආහාර නොලැබීම / ජීවත්වීමට ස්ථීර ආදායම මගක් නොවීම
පාතර් පංචාලි	දුර්ගා අසනීප වීම	අවම වෛද්‍ය පහසුකම් නොලැබීම
අපරාජිතයෝ	වරිච්චි බිත්ති සහිත නිවාස	ජීවත්වීමට ස්ථීර වාසස්ථානයක් නොවීම
අපරාජිතයෝ	වහලය හරහා වැසි වතුර වැටීම	අයහපත් නිවාස
අපරාජිතයෝ	විශාල පිරිසක් කුඩා කාමරයක ඉගෙනුම ලැබීම	අවම අධ්‍යාපන පහසුකම් නොලැබීම
අපූර් සංසාර	රැකියාවක් නොමැතිකම නිසා දුක් විඳීම	විරැකියාව
අපූර් සංසාර	අපූගේ කුටිය	අවම පහසුකම් නොමැති වීම
අපූර් සංසාර	දරු ප්‍රසූතියේදී අපරණා මිය යාම	අවම සෞඛ්‍ය පහසුකම් නොමැති වීම

වගුව 1- කර්තෘ විසින් සම්පාදිතය

නාගරික (1952) හා මේස ධාක තාරා (1960)

රිත්වික් කුමාර් සටක් යනු තමාට ආවේණික වූ ප්‍රකාශන රීතියකින් සිනමාකරණයේ යෙදුණු ප්‍රකට බෙංගාලි සිනමා අධ්‍යක්ෂවරයෙකි. විශේෂයෙන්ම ඔහුගේ සිනමා කෘතිවලට පාදක වූයේ එකල බෙංගාලයේ පැවති සමාජ දේශපාලනික වාතාවරණයයි. ඔහු නිරන්තරයෙන්ම සාමාජික, ආර්ථික සහ දේශපාලනික හේතු නිසා පීඩනයට පත්වුවන්ගේ අත්දැකීම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් චිත්‍රපටකරණයේ නියැලුණු අතර ඔහුගේ සිනමාපට සඳහා බොහෝ සෙයින් ප්‍රස්තුත වූයේ සමාජ පරිපිඨනයයි (සෝමසිරි, 2009). සටක්ගේ මුල් කාලීන චිත්‍රපට වල නාට්‍යමය හා සාහිත්‍යමය ලක්ෂණ ඇතුළත් විණි. එසේ සාහිත්‍යමය ලක්ෂණ ඇතුළත් වූයේ ඔහු පාරම්පරික භාරතීය කලා මාධ්‍යයන්ගෙන් සහ සංස්කෘතියෙන් ආභාසය ලැබූ නිසාවෙන්. එමෙන්ම ඔහු වේද ග්‍රන්ථ හා වෛදික සාහිත්‍යය මැනවින් ප්‍රගුණ කළ අතර ඔහුගේ සිනමාපටවල දෘශ්‍ය කලාව ප්‍රගුණ කිරීමෙහිලා චිත්‍ර කලාව පිළිබඳව ඔහු තුළ පැවති දැනුමද උපයෝගී විය (සෝමසිරි, 2009).

බෙංගාලය, යටත්විජිත යුගයේ පටන් ම නොයෙක් දේශපාලන පෙරළි වලට මුහුණ දුන් සහ ආර්ථිකමය වශයෙන් පීඩාවිද කලාපයකි. බ්‍රිතාන්‍යයන් විසින් 1905 දී බෙංගාලය බටහිර සහ නැගෙනහිර ලෙස වෙන් කරන ලද අතර 1947 දී ඉන්දියානු නිදහසින් පසු භූමි වෙන්කිරීමේදී එය රටවල් දෙකක් බවට පත්වුණි (සෝමසිරි, 2009). එනම් බටහිර බෙංගාලය ඉන්දියාවටත්, නැගෙනහිර බෙංගාලය පකිස්ථානයට අයත් භූමියක් බවට පත්වේ. 1971 දී නැගෙනහිර පකිස්ථානය බංග්ලාදේශ විමුක්ති සටනෙන් පසු බංග්ලාදේශය බවට පත්විය. 1925 දී ඩකා නගරයේ ඉපදුනු රිත්වික් සටක් තරුණවියේදී කල්කටාවට පැමිණෙන අතර ඉන්පසු ඔහු සිනමාවට යොමු විය (සෝමසිරි, 2009).

නාගරික (1952) (The Citizen) සටක්ගේ මුල් ම සිනමාපටය වන අතර, එය ඉහත දැක්වූ බෙංගාලයේ බෙදීම පිළිබඳව සාකච්ඡා කර ඇත. ඔහු මෙම චිත්‍රපටය මගින් "පීඩාකාරී සමාජ බලවේගවලට එරෙහිව ජීවත්වීම සඳහා දරුණු අරගලයක යෙදී සිටින කල්කටාවේ මධ්‍යම පාන්තික පවුලක චිත්තවේග හා චිත්ත පීඩාවන් විශ්ලේෂණය කිරීමට උත්සාහ කරන ලදී" (විද්‍යාපති, 2008, පි. 42).

විශාල නගරයක වීදී දිගේ ඒ මේ අත යමින් සිටින දහස් ගණනක මිනිසුන්ගේ රූප රාමුවකින් චිත්‍රපටය ආරම්භ වන අතර, එහි තවත් එක් රූපයක පැහැදිලිව සනිටුහන් වන්නේ රැකියාවක් සොයමින් යන රාමු නම් චරිතය එම දහස් ගණනක් මිනිසුන් අතර එක් අයෙකු වන බවයි. දරිද්‍රතාවයෙන් පෙළෙන රාමුගේ පවුලේ සියලුම දෙනා ජීවත් වන්නේ පියාගේ විශ්‍රාම වැටුපෙනි. මෙම චිත්‍රපටයේ රූපරාමු මගින් පැහැදිලි වන්නේ රාමු සහ පවුල ජීවත්වන නිවසට හිරු එළිය මදක් හෝ නොවැටෙන, ඉතා අඳුරු බවකින් යුක්ත කුඩා අපිරිසිදු නිවසක් වන බවයි. මෙම කුඩා අපිරිසිදු නිවසේ රාමු සහ ඔහුගේ පවුලේ අය ජීවත් වේ. මෙම කුඩා නිවස පිහිටා තිබෙන්නේ එම ප්‍රදේශයේ ධනවතුන් පදිංචි වී සිටින ප්‍රදේශයක පටු මාවතක කෙළවරය. ඔහු තම කාමරයේ දින දර්ශනයක් එල්ලා තිබෙන අතර, එම දින දර්ශනයේ මුද්‍රණය කර ඇති අන්දමේ නිවසක් සකස් කර ගැනීම ඔහුගේ සිහිනයයි.

මෙම රූපරාමු කිහිපය මගින්ම පෙනී යන්නේ රාමුගේ පවුලට ජීවත්වීමට අවශ්‍ය අවම පහසුකම්වත් නොලැබෙන දරිද්‍රතාවයෙන් යුතු පවුලක් බවයි. ඒ අනුව බෙංගාලයේ පැවති දරිද්‍රතාවය මෙම රූපරාමු කිහිපය මගින්ම පෙන්වා දෙනු ලබයි.

"සටක් කල්කටාව නිරූපණය කරන්නේ එහි සිටින ජනතාව දරිද්‍රතාවයෙන් ගොදුරු කර ගන්නා ‍දදයක්‍රුවකු ලෙසය. ඒ සමගම ඔහු, නගරයට දහස් ගණනින් ගලා එන සරණාගතයන්ගේද, බෙංගාලයේ වේගයෙන් ඉදිරියට ගලා එන දරිද්‍රතාවයේද, මිනිස් ලේ, නාස්තිය හා බලාපොරොත්තු සුන් වීම සමග දැවැන්ත ගලායාමකට නගරය පත් කරන අසරණභාවයේද ගොදුරක් ලෙස දක්වයි"(විද්‍යාපති, 2008, පි. 43).

චිත්‍රපටයේදී රාමුගේ මව නිරන්තරයෙන්ම පශ්චාත්තාප වනුයේ ඔවුන් දරිද්‍රතාවයට ඇද වැටෙන්නට පෙර ඔවුන් ගත කළ ජීවිතය පිළිබඳව සිතමිනි. එය රාමුගේ මවගේ බලාපොරොත්තුවක් වන අතර රාමුගේ පියාගේ දර්ශනය වනුයේ "බලාපොරොත්තුව යනු මායාවක් බවද එහි අවසානය බලාපොරොත්තු සුන් වීම බවද වෙයි" (දිසානායක, 1993). නමුත් මෙහිදී රාමු තම පියාගේ මතයට විරෝධය පළ කරන අතර ඔහු අනාගතය පිළිබඳව සුබවාදී බලාපොරොත්තු දල්වාගෙන සිටින බව චිත්‍රපටයේ රූපරාමු මගින් පැහැදිලි වේ.

එසේ බලාපොරොත්තු දල්වාගෙන සිටියත්, රැකියාවක් සොයමින් වෙහෙසුන ද රාමුට තම අපේක්ෂාවන් ඉටු කර ගැනීමට නොහැකි වේ. අවුරුදු තිස්පහක් දුක් මහන්සි වී සේවයේ යෙදුනද ජීවිතයේ අවසාන කාල පරිච්ඡේදය ආර්ථික අස්ථාවරත්වයට පත්වීම නිසා රාමුගේ පිය දැඩි කලකිරීමෙන් පසුවෙයි. නිසි පරිදි ආහාර, බෙහෙත් නොලැබීම නිසා ඔහු අසනීප තත්ත්වයකට ගොදුරු වෙයි. එම රූපරාමු මගින්ද පැහැදිලි වන්නේ එවකට බෙංගාලයේ මධ්‍යම පාන්තිකයන් මුහුණ දුන් දරිද්‍රතාවය පිළිබඳවයි. මෙම චිත්‍රපටයේ එක් දර්ශනයක රාමුව අමතන ඔහුගේ පිය පවසන්නේ "තමා අවුරුදු ගණනක් දුක් මහන්සි වුවද ගුලක සිටින මීයෙකුට මෙන් තමාට මිය යාමට සිදුව ඇති බවය"

ඒ අනුව වෙනත් ආදායම් මාර්ගයක් නොවූ කල, රාමුගේ පවුලේ උදවිය තීරණය කරනු ලබන්නේ නිවසේ ඇති කුඩා කාමරය කුලියට දීමය. රැකියාවක් සොයා කල්කටාවට පැමිණි සගා නම් චරිතය ඔවුන්ගේ කුලී නිවැසියා වෙයි. දරිද්‍රතාවය නිසා විවාහය ප්‍රමාද වී සිටින රාමුගේ සහෝදරිය වන සීතා වෙත සගාගේ සිත ඇද යයි. එමගින් ද පැහැදිලි වනුයේ බෙංගාලයේ පැවති දරිද්‍රතාවය නිසා ජීවිතයේ අත්‍යවශ්‍ය කටයුතු පවා කල් දැමීමට සිදුවන බවයි. කළ හැකි කිසිවක් නොවීමෙන් රාමු ඇතුළු ඔහුගේ දෙමව්පියෝ ද තීරණය කරනු ලබන්නේ සීතා, සගා වෙත සරණ පාවා දීමටය. එම සරණ පාවාදීමෙන් ඔවුන් බලාපොරොත්තු වන්නේ තම පවුලේ නඩත්තු කටයුතු ද සගා වෙත පැවරීමටය.

මෙම චිත්‍රපටයේ රාමුගේ පෙම්වතිය ලෙස සිටින්නේ උමා නම් චරිතයයි. උමාගේ පවුලද දරිද්‍රතාවයෙන් යුතු පවුලක් වන අතර, එම ආර්ථික අස්ථාවරහාවය නිසාම උමාගේ නැගණිය අනාචාරයේ හැසිරෙන්නියක බවට පත්වෙයි. එමගින් ද පැහැදිලි වන්නේ සමාජයේ පවතින දරිද්‍රතාවය නිසා සමාජයේ මිනිසුන් අනාචාරයට යොමුවන බවයි. නාගරික චිත්‍රපටය කල්කටාවේ මැදපාන්තික පවුලක දරිද්‍රතාවය නිසා පීඩා විදින අයුරු විශ්ලේෂණය කිරීමට සමත් චිත්‍රපටයක් වන බව මෙහිදී පැහැදිලි වේ. එය මධ්‍යම පාන්තික පවුල, පහළ මධ්‍යම පන්තිය දක්වා සෙමෙන් විවලනය වන ආකාරය පෙන්වා දෙයි. එම රූප රාමු මගින්, අතීතයේ ඔවුන් ගත කළ සුබෝපභෝගී ජීවිතයත්, ඉන්පසු ධනවතුන් පදිංචි ප්‍රදේශයක පටු මාවතක කුඩා නිවසක ගත කළ දුක්බිත ජීවිතයත් පෙන්වා දෙයි. "සටක් තමාගේ රූප, වාචික සියුම් බවින් හා අගමුලට පෙරලීමෙන් දරිද්‍රතාවය නිරූපණය කිරීමට උත්සාහ කරන ලද අතර එහිදී ජනයාගේ සිතුම් පැතුම් මෙන් ම චිත්‍රපටයේ කාලය හා අවකාශය ද මෙයට උපයෝගී කරගෙන ඇත" (විද්‍යාපති, 2008, පි. 58).

බෙංගාලයේ දරිද්‍රතාවය පිළිබඳව සටක්ගේ පුද්ගලික සිත් වේදනාව සිනමා තිරයට මෙසේ නාගරික චිත්‍රපටය ඔස්සේ ගලා එයි. දරිද්‍රතාවය නිසා මිනිසුන් සමාජ ඉනිමගේ පහළට තල්ලූ වී යාමේ වේදනාව මෙම චිත්‍රපටය මගින් නිරූපණය කර ඇත. ගුරුවරයෙකුගේ පුතෙකු වන රාමු දරිද්‍රතාවයෙන් තම පවුල බේරා ගැනීම සඳහා කුලී කම්කරුවකු බවට මෙහිදී පත්වෙයි. එසේ කුලී කම්කරුවෙකු බවට පත්වන රාමුගේ වේදනාව මෙන්ම තම වැන්දඹු මව සමග මුදුක්කුවට වී බලා සිටීමේ වේදනාවද මෙම චිත්‍රපටය මගින් නිරූපිතය" (විද්‍යාපති, 2008, පි. 43).

රිත්වි004 සටක්ගේ තවත් එක් විශිෂ්ට සිනමාපටයක් ලෙස මේස ධාක තාරා (1960) (The Cloud Capped Star) හැඳින්විය හැක. මෙම චිත්‍රපටය මගින් ද නිරූපණය කරනුයේ විසිවන සියවස මැදභාගයේ දී කල්කටාවේ පැවති සමාජ තත්ත්වයයි. අතිශය දරිද්‍රතාවයෙන් පෙළෙන සරණාගත පවුලක් කේන්ද්‍ර කොට ගනිමින් මෙම චිත්‍රපටය

නිර්මාණය වී තිබේ (සෝමසිරි, 2009). දිළිඳු සරණාගත පවුලක දියණිය වන නීතා සේවයට යන දර්ශනයකින් මෙම චිත්‍රපටය ආරම්භ වේ. එම පවුලේ වැඩිමහල් දියණිය වන නීතා පවුලේ සියලුම බර ඇය වෙත පවරා ගනී. නීතාගේ පියා ගුරුවරයකු වුවත් ඔහුගේ වැටුප පවුලේ වියදම සඳහා ප්‍රමාණවත් නොවීය. එම නිසා දරිද්‍රතාවයට මුහුණ දීම සඳහා නීතා තම පාසල් ගමන ද අතහැර කාර්යාලයක රැකියාවක් සොයා ගනී. එමගින් ද පැහැදිලි වනුයේ දරිද්‍රතාවය නිසා සමාජයේ පවතින අධ්‍යාපන අවශ්‍යතාවය ද පසෙකලා රැකියාවක් සොයා ගැනීමට සිදුවන බවය. නීතාගේ බාල සොයුරු වන මොන්තු එම දරිද්‍රතාවය නිසාම කර්මාන්තශාලාවක රැකියාවට යයි. පවුලේ සියලු බර කරට ගත් නීතා ක්ෂය රෝගය වැළඳීමෙන් පසුව වුව ද ප්‍රතිකාර ගනිමින් පවා රැකියාවට ද යයි. නීතාගේ වැඩිමල් සොයුරු වන ශංකර් පමණක් පවුලේ අසරණත්වය හා දිළිඳු බව අබියස වුව ද තම ගායකයකු වන සිහිනය අත් නොහරී. පසුව ඔහු සාර්ථක ගායකයෙකු වී නැවත පැමිණෙන අතර, ඔහු තම සොහොයුරිය වන නීතා පිළිබඳව සොයා බලයි. සංකර් නීතාව කඳුකර පෙදෙසක සුවපහසු ස්ථානයකට තමන්ගේ අවසාන කාලය ගත කිරීම සඳහා ගෙන යයි.

මෙම චිත්‍රපටයේ මියැදීමට ආසන්නව සිටින නීතා නගන විලාපය කඳු හෙල් සිසාරා පැතිරී යයි (සෝමසිරි, 2009). දරිද්‍රතාවය නිසා පවුලේ බර සියල්ලම කරට ගත් නීතා, තම පවුල වෙනුවෙන් යුතුකම් ඉටු කළ ද ඇයට මෙවන් ඉරණමකට මුහුණදීමට සිදුවීම ප්‍රේක්ෂකයා කම්පාවට පත් කරන්නකි. නීතා ක්ෂය රෝගයට ගොදුරු වන්නේ දරිද්‍රතාවය නිසාය. විශාල කාලයක් කුසගින්නේ සිටීමේ අතුරු ප්‍රතිඵලයක් ලෙස ක්ෂය රෝගයට ගොදුරු වන බව චිත්‍රපටය මගින් පෙන්වා දී ඇත. අවසාන මොහොතේදී පවා ඇය හඬන්නේ ඇයට ජීවත්වීමට අවශ්‍ය බව කියාය. චිත්‍රපටය නිමවන්නේ නීතා වැනිම තවත් තරුණියක් දෛනික වැඩ අවසන් වී නිවස බලා එන දර්ශනයකිනි. එම දර්ශනය දෙස බලා සිටින සංකර් වෙත පැමිණි වෙළෙන්දෙකු ඔහුගේ පිටට තට්ටුවක් දමා මෙසේ පවසයි. "දුප්පත් කෙල්ල. ඈ ජීවිතයේ බර කොන්ද කැඩෙන තුරු රැගෙන ගියා". මෙම චිත්‍රපටයේ අවසාන දර්ශනය එම ජීවිතවල චක්‍රය සම්පූර්ණ කරයි (සෝමසිරි, 2009). නමුත් එය මෙවර නීතා නොවන අතර තමාගේ සරණාගත පවුල ආරක්ෂා කරගැනීම සඳහා නීතාගේ කාර්යයටම ඇයගේ තැන ගන්නා ලද වෙනත් නාඳුනන තරුණියකි. එමෙන්ම එම රූපරාමු වලින් එම තරුණියගේ ඉරී ගිය සෙරෙප්පුවද දර්ශනය වේ. එයද ඇයගේ පවතින දරිද්‍රතාවය පෙන්වා දෙයි. "නීතා මෙන්ම පෙනුමත්, ශරීර ඉරියව් භාෂාවත්, නීතාගේම පිටපතක් වැනිය. ඒ අය නීතා අතහැර ගිය මඟ ඉදිරියට ගෙනයන්නට බල කරන ලද තරුණියක නිසාය" (විද්‍යාපති, 2008, පි. 45).

ඉරුණු සෙරෙප්පුව පිළිබඳ වූ මෙම රූපරාමුව කල්කටාවේ පැවති දරිද්‍රතාවය පිළිබඳව සටක්ගේ තියුණු චෝදනාව මෙහිදී ප්‍රේක්ෂකයා වෙත ඔහු සියුම් ආකාරයෙන් නිරූපණය කිරීමට සමත් වී තිබේ. එමෙන්ම සමාජයේ පවතින දුගීභාවය හා සමාජ අසාධාරණය පිළිබඳව ද ඔහු මෙම චිත්‍රපටය මගින් සාකච්ඡා කිරීමට සමත් වී තිබේ. සටක්ගේ සිනමා නිර්මාණ අතිශය විවාදාත්මක ඒවා විය (සෝමසිරි, 2009). එසේම ඉන්දියානු ජන ජීවිතයට අදාළ දරිද්‍රතාවය, සමාජ හා දේශපාලන කැලබලකාරී වාතාවරණය ඔහුගේ චිත්‍රපට මගින් නිරූපිතය. ඉහත චිත්‍රපට ද්විත්වයේ දර්ශන කිහිපයක් මගින් දරිද්‍රතා ලක්ෂණ පෙන්වා දෙන බව පහත පරිදි පෙන්වා දිය හැක.

චිත්‍රපටයේ නම	දර්ශනය	දරිද්‍රතාවය විග්‍රහ කරන ලක්ෂණය
නාගරීක්	රාමු රැකියාවක් සොයමින් යාම	විරැකියාව
නාගරීක්	නිවසට හිරු එළිය මදක් හෝ නොවැටෙන, ඉතා අඳුරු බවකින් යුක්ත කුඩා අපිරිසිදු නිවස	අයහපත් නිවස
නාගරීක්	රාමුගේ පියා අසනීප තත්ත්වයකට ගොදුරු වීම	අවම සෞඛ්‍ය පහසුකම් නොමැති වීම
නාගරීක්	විවාහය ප්‍රමාද වී සිටින රාමුගේ සහෝදරිය	ජීවිතයේ අත්‍යවශ්‍ය කටයුතු පවා කල් දැමීමට සිදුවීම
නාගරීක්	උමාගේ නැගණිය අනාචාරයේ හැසිරෙන්නියක බවට පත් වීම	විරැකියාව
මේස ධාක තාරා	නීතා තම පාසල් ගමන ද අතහැර කාර්යාලයක රැකියාවක් සොයා ගනී.	අවම අධ්‍යාපන පහසුකම් නොලැබීම
මේස ධාක තාරා	මොන්තු කර්මාන්තශාලාවක රැකියාවට යයි.	විරැකියාව / අවම අධ්‍යාපන පහසුකම් නොලැබීම
මේස ධාක තාරා	නීතා ක්ෂය රෝගයට ගොදුරු වීම	අවම සෞඛ්‍ය පහසුකම් නොමැති වීම

මේස ධාක තාරා	ඉරී ගිය සෙරප්පුව	ජීවත්වීමට අවම පහසුකම් නොමැති වීම

වගුව 2- කර්තෘ විසින් සම්පාදිතය

සමාලෝචනය

සමාජය සහ සිනමාව අතර පවතින සහජීවන සම්බන්ධය තුළ සමාජ ගැටලු සිනමාකරුවන්ට අමුද්‍රව්‍ය බවට පත්වනවා පමණක් නොව සිනමාවේ ස්වභාවයට හා හැසිරීමටද සංකීර්ණ ලෙස බලපාන බව මෙහිදී පැහැදිලි වේ. අනෙක් අතට සමාජ ප්‍රශ්න වල ස්වභාවය හා හැසිරීම සිනමා නිර්මාණයක් මත දිගහැරෙන ආඛ්‍යානය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරයි. සමාජය සහ සිනමාව අතර ඇත්තේ සංකීර්ණ ගතික අන්තර් සබඳතාවක් වන අතර එහිදී සමාජ ගැටලු චිත්‍රපට නිර්මාණය සඳහා මූලික කොට ගැනීම මගින් ප්‍රේක්ෂකයාට කලා පිපාසයක් සැබෑ අරමුණු සඵල කර ගැනීමේ අවස්ථාවක් හිමිකර දේ. චිත්‍රපට නිර්මාණකරුවන් සමාජයේ විවිධ පැතිකඩයන් හා වෙනස් විය යුතු තැන් තම දෘෂ්ටිවාදයට අනුව තිරය මතට ගෙන එන්නේ සමාජය නව මගකට යොමු කිරීමේ අරමුණ ඇතිවය. සමාජ ගැටලුවල ස්වභාවය සහ හැසිරීම සිනමා නිර්මාණ කෙරෙහිද සෘජුව බලපාන බව මෙම පර්යේෂණය මගින් පැහැදිලි විය. චිත්‍රපට නිර්මාණකරුවන් සමාජ ගැටලු වෙත වගකීමෙන් හා සදාචාරාත්මකව ප්‍රවේශ වීම වැදගත්ය. විනෝදාත්මක වටිනාකම් උදෙසා හෝ වාණිජ්‍ය අරමුණු උදෙසා පමණක් සමාජ ගැටලු සංවේදී කිරීම විපතට පත් වූවන්ගේ සැබෑ ජීවිත අත්දැකීම් අවමානයකට ලක් කර හැකි බැවින් අර්ථවත් බලපෑමක් ඇති කිරීම සඳහා චිත්‍රපට නිර්මාණකරුවන් එවැනි ගැටලු නිරූපණය කිරීමේදී අව්‍යාජ භාවය හා නිරවද්‍යතාව සඳහා උත්සාහ කළ යුතුය.

සමස්ත මානව සමාජය තුළම වර්ධනය වෙමින් පවත්නා සමාජ ප්‍රශ්නයක් ලෙස දරිද්‍රතාව හැඳින්විය හැක. විවිධ චිත්‍රපට මගින් සමාජයේ මිනිසුන් මුහුණ මුහුණපාන ලබන දරිද්‍රතාව පෙන්වා දී ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේදී සත්‍යජිත් රායි හා රීත්වික් සටක්ගේ විසින් නිර්මාණය කරන ලද අපූ ත්‍රිත්වය හා නාගරික් හා මේස ධාක තාරා යන චිත්‍රපට විමර්ශනය කරන ලදී. චිත්‍රපට කිහිපයම අන්තර්ගතය විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ සත්‍යජිත් රායි හා රීත්වික් සටක් විසින් බෙංගාලි සමාජයේ ඇති දරිද්‍රතාව නැමැති සංකල්පය තම සිනමා නිර්මාණ තුළින් සියුම්ව පෙන්වා දී ඇති බවයි. ඒ අනුව මෙම පර්යේෂණය මගින් පර්යේෂණ ප්‍රශ්නයට විසඳුම් ලබාදීම සිදුකර ඇත.

ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

Dawasin Dawasata: පාතර් පංචාලි (Song of the Little Road). (2015, March 14). Dawasin Dawasata. http://dawasindawasata.blogspot.com/2015/03/song-of-little-road.html

Dewapriya, S. (n.d.). *Sathyajith Rai*.

George, H. (1879). *PROGRESS AND POVERTY: an inquiry into the cause of industrial depressions and of increase of want... with increase of wealth . . . the remedy.* Dover Pubns.

Ghatak, R. (Director). (1952). *Nagarik* [Bengali].

Ghatak, R. (Director). (1960). *Meghe Dhaka Tara* [Bengali].

Hazlitt, H. (2007). *The conquest of poverty*. The Ludwig Von Mises Institute. (Original work published 1973)

Ray, S. (Director). (1955). *Pather Panchali* [Bengali]. Aurora Film Corporation.

Ray, S. (Director). (1956). *Aparajito* [Bengali]. Merchant Ivory Productions.

Ray, S. (Director). (1959). *Apur Sansar* [Bengali]. Satyajit Ray Productions.

Thushi. (2017, December 31). *සිනමා තිරය මත මිනිස් ජීවිතය සිතුවම් කළ සත්‍යජිත් රායි*. Mirrorarts.lk. https://mirrorarts.lk/featured/2465-satyajit-ray

Todaro, M. P., & Smith, S. C. (2020). *Economic development*. Harlow, United Kingdom Pearson Hallbergmoos Pearson Deutschland Gmbh.

අතපත්තු, ඩැනී. (2011). ආර්ථික විද්‍යා ප්‍රවේශය. කතෘ ප්‍රකාශන

අමරසේකර, දයා. (1988). ශ්‍රී ලංකා සමාජය. ආරිය ප්‍රකාශකයෝ. වරකාපොල

පෙරේරා, ස්වර්ණලතා. (2006). සමාජ ගැටලු. වින්දන ප්‍රකාශකයෝ. නුගේගොඩ.

එදිරිසිංහ, එස්. (2016). දරිද්‍රතා සංකල්පය ආශ්‍රිත න්‍යායාත්මක විග්‍රහයක්. ආර්ථික විද්‍යා පර්යේෂණ ග්‍රන්ථය

සෝමසිරි, සුජානි. (2009). බෙංගාලි සිනමාවේ විප්ලවීය සිනමාකරු රීත්වික් සටක්. මානව ශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 11, 287-315.

විද්‍යාපති, මනුබන්දු. (2008). රීත්වික් සටක් රිදී තිරයේ කැරලිකරුවා. විදර්ශන ප්‍රකාශන.

දිසානායක, විමල්. (1993). රීත්වික් සටක් සිනමාව. *සිනෙසිත්, 26*, 13.

A STUDY OF THE DEVELOPMENT OF BHARATANATYAM DURING THE CHOLA PALLAVA PERIOD

IMPSA Manawasinghe[1]

Abstract

Bharatanatyam is the most celebrated art from in the southern Indian state in Tamil Nadu. Bharatanatyam is renowned for its ability to express ideas and stories from Hindu myths, making it a profound cultural and artistic tradition. This art form has been in existence for more than two thousand years. Bharatanatyam has certainly been an important part of ceremony, rituals, celebrations, and entertainment. In the past India, Bharatanatyam was called as Dasi Attam, Sadeer Attam, Koothu, Sinnamolam and Devadiyar. This dance tradition flourished under the patronage of the Chola and Pallava Kings, making their contributions essential to its development. Cholas and Pallavas were great patrons of art and dance. The kings supported Buddhism, Jain, and Hindu institutions, and many of the temples and shrines they build were among the finest example of Indian architecture. During the period when the 3rd Nandivarman king was ruling, devadasis were made to conduct musical and dance performances during the poojas and other religious festivals in the temples, constructed as prescribed in the sacred books. 1st Rajarajan, the king of Chola was very much interested in music and dance. The main aim of this research is to find out whether Bharatanatyam developed as a dance during the Chola Pallava period. The objective of this research paper is to conduct a comprehensive investigation into the historical development of Bharatanatyam during the Chola Pallava Period. For this study, I conducted a thorough review of existing secondary data sources. These sources encompassed a variety of materials, including library books, magazines, research papers and research articles. The importance of this research is that scholars, university students and who are interested in the history of Bharatanatyam. Finally, this study gives guidelines to understand the development of Bharatanatyam dance through Devadasis during Chola Pallava Period. As the final result of this research, it can be concluded that during the Chola Pallava period there was a development of Bharatanatyam dance with the contribution of the kings.

Keywords: Bharatanatyam, Chola Pallava Period, Devadasi, Development

[1] Postgraduate Institute of Humanities and Social Sciences, University of Peradeniya, Sri Lanka

Email: impsa.manawasinghe@gmail.com   https://orcid.org/0009-0006-2712-3555

චෝල පල්ලව අවදියේ හරතනාට්‍යම් නර්තනයේ සිදු වූ සංවර්ධනය පිළිබඳව අධ්‍යයනයක්

අයි.එම්.පී.එස්.ඒ. මානවසිංහ

සාරසංක්ෂේපය

හරතනාට්‍යයම් යනු දක්ෂිණ භාරතයේ තමිල්නාඩු ප්‍රාන්තයේ වඩාත්ම කීර්තිමත් නර්තන කලාවයි. හින්දු මිථ්‍යාවන් මූලික කර ගත් කතා ප්‍රවෘත්තීන් ඉදිරිපත් කිරීමට හරතනාට්‍යම් නර්තන සම්ප්‍රදායට පවතින ශක්‍යතාවය මගින් එය ගැඹුරු සංස්කෘතික හා කලාත්මක සම්ප්‍රදායක් බවට පත් කර ඇත. දෙදහස් වසරකට වඩා පැරණි හරතනාට්‍යයම් නර්තන සම්ප්‍රදාය උත්සව, චාරිත්‍ර, සැමරුම් සහ විනෝදාස්වාදයේ වැදගත් අංගයක් බවට පත් වී ඇත. අතීතයේදී භාරතනාට්‍යයම් දාසි අට්ටම්, සදීර් ආට්ටම්, කුත්තු, සින්නම්මලම් සහ දේවදියර් ආදී ලෙස හැඳින්විය. මෙම නර්තන සම්ප්‍රදාය චෝල සහ පල්ලව රජුන්ගේ අනුග්‍රහය යටතේ සමෘද්ධිමත් වූ අතර, එහි වර්ධනයට ඔවුන්ගේ දායකත්වය අත්‍යවශ්‍ය විය. චෝලයන් සහ පල්ලවයන් කලාවට සහ නර්තනයට විශිෂ්ට ලෙස අනුග්‍රහය දැක්වීය. රජවරු බුදු දහම, ජෛන සහ හින්දු ආගම් සඳහා අනුබල දුන් අතර, ඔවුන් ගොඩනගන ලද බොහෝ පන්සල් සහ සිද්ධස්ථාන අති විශිෂ්ට ඉන්දියානු ගෘහ නිර්මාණ ශිල්ප අතර විය. පූජනීය ග්‍රන්ථවල සඳහන් පරිදි 3 වැනි නන්දිවර්මන් රජු, රාජ්‍ය පාලනය කරන සමයේ ඉදිකරන ලද විහාරස්ථානවල පූජා සහ වෙනත් ආගමික උත්සව අවස්ථාවන් වලදී සංගීත හා නැටුම් ප්‍රසංග පැවැත්වීමට සඳහා දේවදාසීන් යොදවන ලදී. 1 වන රාජ රාජන් නම් චෝල රජු සංගීතයට හා නැටුම්වලට බෙහෙවින් ඇලුම් කළේය. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ චෝල පල්ලව යුගයේදී හරතනාට්‍යම් සම්ප්‍රදාය නර්තනයක් ලෙස වර්ධනය වුවාද යන්න සොයා බැලීමයි. මෙම පර්යේෂණ පත්‍රිකාවේ පරමාර්ථය වන්නේ චෝල පල්ලව යුගයේ හරතනාට්‍යම් හි ඓතිහාසික වර්ධනය පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදු කිරීමයි. මෙය විස්තරාත්මක අධ්‍යයනයක් ලෙස සිදු කර ඇති අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමය අනුගමනය කෙරේ. දත්ත රැස් කිරීම සඳහා ලිඛිත මූලාශ්‍ර අධ්‍යයනය කෙරෙන අතර පවතින ද්විතීයික දත්ත මූලාශ්‍ර පිළිබඳ සම්පූර්ණ සමාලෝචනයක් සිදු කරන ලදී. එහිදී පුස්තකාල පොත, සඟරා, පර්යේෂණ පත්‍රිකා සහ පර්යේෂණ ලිපි ඇතුළු විවිධ ද්‍රව්‍ය ඇතුළත් ආදී ලිපි රැසක් අධ්‍යයනය කරන ලදී. මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ විද්වතුන්, විශ්ව විද්‍යාල සිසුන් සහ හරතනාට්‍යම් ඉතිහාසය පිළිබඳව උනන්දුවක් දක්වන අය සඳහා වේ. අවසාන වශයෙන්, මෙම අධ්‍යයනයෙන් චෝල පල්ලව යුගයේ දේවදාසීන් හරහා හරතනාට්‍යම් නර්තනයේ වර්ධනය අවබෝධ කර ගැනීමට මාර්ගෝපදේශ සපයයි. මෙම පර්යේෂණයේ අවසාන ප්‍රතිඵලය ලෙස චෝල පල්ලව යුගයේ රජවරුන්ගේ දායකත්වයෙන් හරතනාට්‍යම් නර්තන සම්ප්‍රදායේ දියුණුවක් ඇති වූ බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : හරතනාට්‍යයම්, චෝල පල්ලව යුගය, දේවදාසි, සංවර්ධනය

හැඳින්වීම

දක්ෂිණ භාරතයේ තමිල්නාඩුව කේන්ද්‍ර කර ගනිමින් සම්භාව්‍ය හරතනාට්‍යම් නර්තන සම්ප්‍රදාය ප්‍රභවය ලැබීම, අතිශයින්ම පුරාණ මිථ්‍යා කතා, සහ ආගම සමග අතිශය බද්ධ වී පවති. ඈත අතීතයේ සිටම භාරතීය සංස්කෘතියේ නර්තන කලාව ට අති විශේෂ වූ ස්ථානයක් හිමි වූ අතර, විවිධ යුග පසු කරමින් නිදහස් භාරතය ඇතිවන තෙක්ම, භාරතීය නර්තන කලාව රටම ආවේණික ඉතිහාසයකට ද හිමිකම් කියනු ඇත. ආර්යයන් මධ්‍යම ආසියාවේ සිට ඉන්දියාව ට පැමිණ එහි වාසස්ථාන ඉදි කොට ගෙන, සිය සභ්‍යත්වය හා සංස්කෘතිය ගොඩනඟා ගැනීමට උත්සුක වූ කාල පරිච්ඡේදය වන වෛදික යුගයේ සිටම, එරට පැවති නර්තන කලාව පිළිබඳව ඓතිහාසික පුරාවිද්‍යාත්මක සහ සාහිත්‍යමය මූලාශ්‍ර වලින් තොරතුරු බොහොමයක් ද අනාවරණය වී ඇත. (M, 2012) අධිරාජ්‍ය පාලනය හා යටත්විජිත පාලන ක්‍රමයත් සමඟම දියුණු වෙමින් පසුවන, තුන්වන ලෝකයේ රටවල් එදිනෙදා ජීවිතයේදී පීඩාවට පත් වූ අවදියක් වුවද, හරත නාට්‍යම් යනු සංගීතය, කලාව එකට එකතු කරන ඉන්දියානු සම්භාව්‍ය නර්තනයේ උච්චතම අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැක. (Juhi, 2021) මුල් කාලීනව කෝවිල් ආශ්‍රිතව ගොඩ නැඟුණු හරතනාට්‍යම් හි මුල් අවදිය වන සදීර් ආට්ටම් රඟ දක්වන ලද්දේ, දේවාල වල එදිනෙදා කෝවිලේ ආවතේව කටයුතු සිදු කරමින්, දෙවියන්ට පේ වෙමින්, තම ආත්මයම දෙවියන්ට කැප කලා වූ **දේවදාසීන්** නමින් හැඳින්වූ කාන්තාවන් විශේෂයක් විසිනි. හරතනාට්‍යම් නර්තන සම්ප්‍රදාය බොහෝ රජවරුන් හා පාලකයන් විසින් මූර්තිමත් කර ඇති අතර, චෝල රාජවංශය තුල හරතනාට්‍යම් නර්තන ශෛලිය සමෘද්ධිමත් වූ බව මූලාශ්‍ර අධ්‍යයනයෙන් පැහැදිලි වේ. හරතනාට්‍යම් නර්තන ශෛලියහි උන්නතිය උදෙසා චෝල පල්ලව අවදියේදී ලද දායකත්වය කෙතරම් දුරට ඉවහල් වී තිබේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ.

පර්යේෂණ ගැටලුව

හරතනාට්‍යම් නර්තන ශෛලියෙ හි උන්නතිය උදෙසා චෝල පල්ලව අවදියේදී ලද දායකත්වය කෙතරම් දුරට ඉවහල් වී තිබේ ද?

පර්යේෂණයේ අරමුණ

මෙම පර්යේෂණ පත්‍රිකාවේ පරමාර්ථය වන්නේ චෝල පල්ලව යුගයේ දී හරතනාට්‍යම් නර්තනයේ ඓතිහාසික වර්ධනය පිළිබඳ පුළුල් විමර්ශනයක් සිදු කිරීම හා චෝල පල්ලව යුගයේ දේවදාසීන් හරහා හරතනාට්‍යම් නර්තනයේ වර්ධනය අවබෝධ කර ගැනීමට මාර්ගෝපදේශ සැපයීමයි.

පර්යේෂණ ක්‍රමවේදය

ද්විතීක සාහිත්‍ය මූලාශ්‍ර, පුස්තකාල අධ්‍යනය මගින්, ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ වාර්තා, පොත් පත්, සඟරා, ලිපි ලේඛන, හා අන්තර්ජාලය ඇසුරින් දත්ත එක් රැස් කිරීම ආදි ක්‍රමවේද අනුගමනය කරමින් මෙම පර්යේෂණ සිදු කෙරුණි.

ප්‍රතිඵලය සහ සාකච්ඡාව
චෝල පල්ලව අවදිය හා කලාව

තාන්ජෝර්ය අවට ප්‍රදේශය චෝලයන්ගේ ප්‍රධාන මධ්‍යස්ථානය වූ අතර චෝලයන්ගේ පාලනය විජයාලය රජුගෙන් ආරම්භ විය. චෝල රාජ්‍ය පාලන සමය දැඩි ශිව භක්තිය ප්‍රවිලිතව තිබූ අධියක් වූ අතර, කෝවිලට ප්‍රමුඛ ස්ථානයක් හිමි විය. චෝල යුගයේ විසූ සියළුම පාලකයන් ශිව හක්තිකයන් වූ බැවින් චෝල යුගයේ මුල් කෝවිල් සංඛ්‍යාව ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වන්නට විය.

චෝල පල්ලව පාලන සමයේ පැවතියේ රාජාණ්ඩු පාලන ක්‍රමයක් වූ අතර චෝල පල්ලව රාජ්‍ය භාරතයේ නැගෙනහිරින් හා බටහිරින් මුහුද දක්වා ද, උතුරින් තුංගබදු නදිය දක්වා ද පැතිරී තිබුණි. තාන්ජාවුර් මෙහි අගනුවර විය. චෝල යුගයේ හින්දු ආගමට ප්‍රධාන වශයෙන් ලබා දුන් දායාද අතර කෝවිල සහ මඨ යන සංස්ථා දෙක ප්‍රමුඛ වේ. ක්‍රි. ව. 9 වන සියවසේ පල්ලව රාජ්‍යය ට පසු චෝල ගෘහ නිර්මාණ බිහිවිය. චෝල දේවස්ථාන ගෘහ නිර්මාණ ශ්‍රී ලංකාවේද ප්‍රවිලිත කළ බවට නිදසුන් ඇත. ඉන්පසු රාජරාජදේව රජ විජයග්‍රහණය කළෙන් ඒ සැමරීම වස්, තාන්ජාවුර් හි ශිව දෙවොලක් ගොඩ නගන ලදි. ශත වර්ෂ දෙකකට ආසන්න කාලයක්, පාණ්ඩයන් විසින් රජකම් කළ අතරතුර ගෘහ නිර්මාණකරණයේ සුළු සුළු වෙනස්කම් කරන ලද වුව ද, ක්‍රිස්තු වර්ෂ 1565 සිට 1950 අතර වූ කාලය රජකම් කළ විජේනගර් රජ විසින් නැවත ඉතා විශිෂ්ට අන්දමින් එහි තේජස් මහිමය නගා සිටුවන ලදි. එලෙස චෝල යුගයේදී කෝවිල් බොහෝ ඉදිවිය. ක්‍රි. ව. 7 වන සියවසේ දී ඓතිහාසික කෝවිල් වාස්තු විද්‍යා ශිල්පයෙහි ආරම්භය පිළිබඳව සතිඟුහන් වේ. (fyar & huqkd, 2004)

කවියෙකු, සංගීත ශිල්පියෙකු, හා නාට්‍යකරුවෙකු ලෙස එවකට පැවති කලාවන්ට රාජ්‍ය අනුග්‍රහය ලබා දුන් ඉතා කීර්තිමත් පල්ලව රාජ්‍ය නායකයෙකු ලෙස මහේන්ද්‍රවර්මන් (ක්‍රි. ව. 600 - 630) රජු පෙන්වා දිය හැක. ජෛව හක්තිකයෙකුව සිටි ඔහු පසු කාලීනව තිරුනාවුකර්ෂු නායනර් (අප්පර්) නැමැති දමිළ සෑඹිගේ බලපෑමෙන් ශෛව හක්තියෙකු බවට පත් විය. එමෙන්ම මහේන්ද්‍රවර්මන් ගේ පුත් නරසිංහ වර්මන් හා ඔහුගේ පුත් රාජසම්හ (ක්‍රි. ව. 685 - 705) ඔවුනටම ආවේණික වූ ගෘහ නිර්මාණ ශෛලියක නියැලුණේය. (mS', 2004)

සෑම ඉන්දිය දෙවොලකම මූඛ්‍ය පරමාර්ථය වූයේ දෙවියා හා මිනිසා අතර සම්බන්ධතා ගොඩ නැගීමයි. එකි හේතුව කරණ කොට ගෙන, කෝවිල් ආශ්‍රිතව පුරාණ හින්දු දේව කතා හා හින්දු දෙවිවරුන්ගේ රූකම් හා කැටයම් බහුලවශයෙන් විද්‍යාමාන වේ. දේවස්ථානයන්හි නෙලන ලද නර්තන මූර්තීන් හා කැටයම් සලකා බලන කල තන්ජාවුර් "කුම්හකෝනම්", "විදම්බරම්," "තිරුවානමලෙයි" සහ "චූඩවලම්" යන දේවස්ථාන පසෙහි ආරූඪ්‍ය ආශ්චර්යය අනහිනවනීය ය. තාන්ජාවුර් චෝල පෙළපතේ ආරම්භකයා පල්ලවයින්ගේ සාමන්ත පාලකයෙකු වූ, විජ්‍යාලයයි. (Salimani, 2016)

චෝල පල්ලව අවදියේ පැවති නර්තන කලාව

රාජ්‍ය පරිපාලනය සඳහා විජයාලය රජුට සහය වීමට පත් වීම ලද උසස් නිලධාරී මන්ත්‍රී මණ්ඩලයේ නිලධාරීන් අයියරන්, පේරයියන් ලෙස හැඳින්වූ අතර, නැටුම පිළිබඳ නිලධාරියා නිත්ත පේරයියන් ලෙස හැඳින්විණි. :පී.ල 2004* මෙලෙස නර්තන කලාව පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කරමින් නර්තන කලාව නගා සිටුවීමට චෝල පල්ලව අවදියේ රජවරු මහත් උත්සුක වී ඇත.

දේවර්නායකම් යනුවෙන් රාජරාජ රජුගේ කාලයේ දී තේරාරම් - ස්තෝත්‍ර, ගීතිකා පිළිබඳව අධීක්ෂකවරයෙකුව සිටි බවට සාධක තිබේ. විජ්‍යාලය රජුගෙන් අනතුරුව, 1 වන පරන්තක රජුගේ කාලයේ පටන් චෝල රජු නිතිපතා වාද්‍ය භාණ්ඩ සමග ගීතිකා ගායනා කිරීමට ඉඩ සලසා තිබූ චෝල ලේඛන වලින් පෙනේ. මෙයින් පැහැදිලි වන්නේ ගීතිකා ගැයීම සහ නර්තනය සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවා තිබූ බවයි. චෝල සහ පල්ලව පාලන සමයේ දී හරත ඇතුල සංගීත, නාට්‍ය, අත්කම් ආදි කලාවන්ට විශිෂ්ට අනුග්‍රහයක් ලැබුණි. චෝල සහ පල්ලවයන් කෝවිල් ඉදි කිරීම සහ ඒවා තුළ නැටුම් හා සංගීත ප්‍රවර්ධනය කිරීමට සහය විය.

චෝල පල්ලව අවදියේ හරතනාට්‍යම් නර්තන කලාවට ලද දායකත්වය

දක්ෂිණ භාරතයේ තමිල්නාඩු ප්‍රාන්තයේ කේන්ද්‍ර කරගනිමින්, වර්ෂ 2000කට වඩා පැරණි ශාස්ත්‍රීය නර්තන ශෛලියක් ලෙස හඳුන්වා දිය හැකි හරතනාට්‍යම් භාව, රාග සහ තාල මුල බීජ කරගෙන බිහිවී ඇත.

හින්දු ආගම හා බැඳි හරතනාට්‍යම් නර්තනය, චෝල රාජ්‍ය පාලන යුගයේ ඓතිහාසිකව සංවර්ධනය වූ ආකාරයත්, දේවදාසීන්ගේ උන්නතිය උදෙසා රාජ්‍ය අනුග්‍රහය ලද ආකාරයත්, එනම් ආගම, දේවදාසී සංකල්පය, රාජ්‍ය අනුග්‍රහය, හා සංවර්ධනය ආදි ලෙස ප්‍රධාන පැතිකඩ කිහිපයක්, චෝල පල්ලව සමයේ හරතනාට්‍යම් කලාවේ ඇති වූ උන්නතිය පිරික්සීමේ දී විමර්ශණය කල හැක.

චෝල සහ පල්ලව රාජ්‍ය පාලන සමයේ දී, කෝවිල් වල චාරිත්‍ර වාරිත්‍ර සමග සම්බන්ධ වූ අනිවාර්ය අංගයක් ලෙස හරත නාට්‍යයම් සම්ප්‍රදාය නම් කල හැක. කෝවිල් තුළ දෙවියන්ට පූජා පැවැත්වීම, සුවඳ දුම් ඇල්ලීම, මල් පහන් පූජා කිරීම, හා දෙවියන් වෙනුවෙන් නර්තනයේ යෙදීම ආදි කටයුතු දේවදාසීන් ට භාරව තිබූ අතර, කෝවිල සහ දෙවියන් සඳහා කැප වූ එම දේවදාසීන්ව සහ දේවදාසී නර්තන දේවත්වයෙන් සලකනු ලැබීය. හරත නාට්‍යම් නර්තන අංගයන්, ආගමික තේමා මත කේන්ද්‍රගත වූ අතර, හින්දු මිථ්‍යා කතා වලින් නිරූපණය කරන ලදී.

තිරුප්පඩිග ගී වලට, අභිනය සමග නර්තනයන් යෙදෙන තරුණියන් සිටි අතර "ශිව ඥාන සම්බන්ධ තලෙයිකෝළි" නමින් නර්තනයේ යෙදෙන තරුණියන් සැරසී ඇත. තිරුවෝතියූර්හි කෝවිලේ නැටුම් හා ගායනයන් ඉදිරිපත් කිරීමට නර්තන ගුරුවරයෙකු සමග නර්තන ශිල්පීන් විසි දෙකක් සේවය කර ඇති බවට මූර්ති වල සටහන් වී ඇත. තිරුවෝතියූර්හි රජු වූ තුන් වන රාජ රාජන් රජු "උරවක්කිත තලෙයිකොලි" නමින් හැඳින්වූ එක්තරා දේවදාසියකගේ නර්තන ප්‍රසංගයක් දුටුවේය. එම රංගනය ගැන ඔහු පැහැදී, ඔහු ඇයට භූමි ප්‍රදේශයක් පරිත්‍යාග කළ අතර, මෙම ප්‍රදේශය "උරවක්කිත නල්ලූර්" යන නම දරණ නව ගම්මානයක් ලෙස පිළිගැනීමට ලක්විය. තිරුවරුර් කෝවිලට අයත් "පරවයි නන්ගය" යන පදවි නාමය දරණ දේවදාසියන්, පළවන රාජරාජන් රජු විසින් ගෞරවය පිණිස, ඔහුගේම රාජකාරී රටවලින් රැගෙන ගිය බවට සටහන් වී ඇත. ඇය තිරුවරුර් කෝවිලේ අලුත්වැඩියා කටයුතු කරගෙන යාමට ඇගේ ඉඩම් ද පරිත්‍යාග කර ඇත. (Antony, History of Bharatanatyam, 2019)

ශිව භක්තිකයන් වූ සියලු චෝල රජවරු, දෙවියන් කැමති නර්තනයට අනුග්‍රහය දැක්වූහ. ඊ්බන්රල 2021* ඉන්දියානු සමාජයේ පිළිගැනීමට අනුව ශිව යනු දෙවියන් අතර අග්‍රගණ්‍ය නර්තකයා. අද්‍යතනයේ පවා ඉන්දීය නර්තන ශිල්පීන් තම රැඟුම් තුල ශිව දෙවියන් නිරූපණය කිරීම බහුල වශයෙන් සිදුවන ඇත. උත්තර ප්‍රදේශයේ හි යෝගියෙකු හා දාර්ශනිකයෙකු යනුවෙන් ද, දකුණු ඉන්දියාවෙහි හඳුන්වනු ලබන ශිව දෙවිඳුන් විශ්වයෙහි මැවීම, පැවැත්ම, හා විනාශයෙහි සංකේතය යි. :පී.ල 2004*

හින්දු ආගමික මූලයන්ගෙන් ආරම්භ වී, ආගමික දේවාල වල ඉතා පවිත්‍ර ව ආරම්භ වූණු හරත නර්තනය, පසු කලෙක දේශපාලනික බලපෑම් මත විවිධ හැලහැප්පීම් වලට ලක්ව සාමාන්‍ය ජනතාවගේ මෙන්ම, රාජ මාලිගාවේ ද හුදු විනෝදාස්වාදයට පත් වූ රංග ශෛලියක් විය. බ්‍රාහ්මණ නොවන ඉන්දියාවේ කුල හීනයන් අතරින්, වඩාත්ම පහත්ම කුල යැයි සැලෙකන දාලිත්, මාදිඝා හා වාල්මීකි ආදි කුලයන්හි රූමත් ගැහැණු දරුවන්, දේවදාසීන්ගේ භූමිකාව ඉදිරිපත් කර ඇති අතර, රජවරුන්ගේ අනුග්‍රහය යටතේ රජවරුන් පිනවීම සඳහා ඉදිරිපත් වීම ද කාලයාගේ ඇවෑමෙන් දේවදාසීන් හරහා සිදුවිය. සමස්තයක් ලෙස කෝවිල්වල නටන දේවදාසීන් ලෙස හරතනාට්‍යම් නටන කාන්තාවන් හැඳින්විය. චෝල සහ පල්ලව යුගයන්හි දී හරතනාට්‍යම් සැලකිය යුතු වර්ධනයකට ලක් වූ අතර තමිල්නාඩුවේ හා දකුණු ඉන්දියාවේ සංස්කෘතික හූ දර්ශනයන් වන තමිල්නාඩුව, ආන්ද්‍ර ප්‍රදේශ්, කේරල, කර්ණාටක, හා ශ්‍රී ලංකාව භූමිකාවන් ලෙස ඉටු කළේය. (Srinivasan, 28th January, 2007)

"හින්දු ධර්මය සාමාන්‍ය ජන ජීවිතයට අවශ්‍ය පරිදි පවත්වාගෙන යාමේ අරමුණු ඇතිව, බ්‍රාහ්මණයන්ගේ තන්ත්‍රයන් ගොඩනගා ගෙන ඇති බව මෙම රංග ශෛලියේ අතීත සම්භාව්‍ය සොයා බැලීමේදී හෙළි වන කරුණකි. දෙවියන් පිදීම, සංගීතය හා නර්තනය ඇසුරු ව පවත්වාගෙන යෑමට හුරු පුරුදු වූ බ්‍රාහ්මණ පූජකයෝ දේවාල කාර්යෙහි ඇතැම් පැතිකඩ පූර්ණය කර ගැනීම සඳහා කාන්තාවන් යෙදවූහ. මොවුන් සඳහා වෙන්වූ කාර්යභාරයන් පැවති අතර, ඇතැමකුගේ කාර්යය වූයේ දෙවියන් උදෙසා නර්තනයේ යෙදීමය. මෙම කාන්තාවන් දේවදාසීන් ලෙස හඳුන්වනු ලැබූ අතර, ඔවුන්ගේ නැටුම් දාසි නැටුම්, හෙවත් සදිර් ආට්ටම් යන නමින් හඳුන්වනු ලැබීය. තාන්ජාවුර් දිස්ත්‍රික්කය දාසි ආට්ටම් පිළිබඳව විශේෂ ප්‍රසිද්ධියක් ඉසිලීය. ඉතා සුවිශේෂ පූජනීය දේවස්ථානයන් පිළිබඳව ද ප්‍රසිද්ධියක් ඇති තාන්ජාවුර් දිස්ත්‍රික්කය මුම්මනින්ම පාහේ නර්තනය සඳහා ක්ෂේම භූමියක් වූයේ. මෙහි දේවාල වල ඇතැම් අවස්ථාවන් හි දේවදාසීන් 500ක් පමණ එකවර නෘත්‍ය දැක්වූ අතර චෝල පාණ්ඩ්‍ය ආදි රජවරු මොවුන්ගේ නඩත්තු කටයුතු භාරව කටයුතු කල බවට ද සාධක ලැබේ." (fÊ', 2001)

පළමුවන රාජේන්ද්‍ර රජ කල නර්තනයට සහ සංගීතයට ඉතාමත් සෞභාග්‍යමත් අවදියක් විය. එවකට කෝවිලට අනුබද්ධිතව නර්තනයේ යෙදෙන කාන්තාවන් 400ක් දෙනා සිටියහ. කෝවිල හෝ රජුගේ රාජ්‍ය අනුග්‍රහය සහිතව මුත්තුකාරන් නමින් හඳුනවන ලද නට්ටුවනාර්වරු, සංගීතඥවරු සහ මෘදංග වාදකයන් බොහොමයක් දෙනා වාසය කළහ. (Sarabhai, 2000)

"දේවදාසීන් සඳහා රංගනය සඳහා දේවස්ථානයන් හි ඉදිකොට තිබූ මණ්ඩප නෘත මණ්ඩප, නාට්‍ය මණ්ඩප, මහා මණ්ඩප සහ අර්ධ මණ්ඩප යනාදී නම් වලින් හැඳින්විය. සන්තානාර් ගේ කුතනූල්, ඉලංගෝ ආඩිගල් ගේ සීලප්පදිකාරම් සහ පෙරියපුරම් (දෙවන ශතවර්ෂය) දේවදාසීන් සම්ප්‍රදාය පිළිබඳ තොරතුරු සඳහන් ග්‍රන්ථ වේ." (mS', 2004)

නර්තන කලාව භාවිතයට ගනිමින්, දෙවියන්ට සේවය සැපයූ කාන්තාවන් "දේවරාදියර්" යන නමින් ද, " කුතියර් " යන නමින් කුතු කලාව තම රැකියාව බවට පත් කරගත් කාන්තාවන් ද, " පතිලර් " ලෙස අවිවාහකව සිටිමින් දෙවියන්ට තම ආත්මය කැප කළ කාන්තාවන් ද, " විරලියර් " ලෙස දෙවොලේ නර්තන කලාවට ගෞරව කරන කාන්තාවන් ද හැඳින්විය. (Antony, History of Bharatanatyam, 2019)

දෙමළ භාෂාවෙන් "දේවාදියර් " හා සංස්කෘත භාෂාවෙන් දේවදාසි යන නමින් හැඳින්වූ, දෙවියන්ගේ අඩවියේ සිටි යුවතියන්, දේවදාසි සංකල්පය ලෙස තමිල්නාඩුවේ ප්‍රසිද්ධියට පත් වන්නේ 600-1800 කාලපරිච්ඡේදයේ දී ය. විජයනගර් රාජ්‍ය සමයේ ඔවුන්ගේ දේවදාසි නාමය ව්‍යාප්ත විය. ඉන් අනතුරුව දෙවියන්ට ඇප කැප වූ කාන්තාවන් තමිල්නාඩුවේ පමණක් නොව මුළු ලෝකය පුරාම ව්‍යාප්ත විය. පන්නර්, කුතාර්, අගවුතාර්, පොරුනර් ලෙස හැඳින්වූ කාන්තාවන්, තම රජුගේ කීර්තිය වෙනුවෙන් කටයුතු කළ අතර ඔවුන්, "පුරවැසියන් රජුට පමණයි " වැනි සටන් පාඨ යොදා ගත්හ. රජවරුන්ගේ තේජස්භාවය, වීරත්වය ඔවුන්ගේ ගීත හා නර්තන තුළ දක්නට ලැබුණි. පාණ්ඩ්‍යන් හා පල්ලවයන් අතර ඇති වූ තිරුපුරාම්බියර් යුද්ධයේ ආරම්භයේ තුනංගෙයි හා කුරවයි නර්තනයන් ඉදිරිපත් කළහ. (Antony, History of Bharatanatyam, 2019)

තුන්වන නන්දිවර්මන් රාජ්‍ය සමයේ, පූජනීය ග්‍රන්ථවල දක්වා ඇති පරිදි, ඉදි කරන ලද කෝවිල්වල පූජා සහ අනිකුත් ආගමික උත්සවවලදී සංගීත හා නැටුම් ප්‍රසංග පැවැත්වීම සඳහා දේවදාසීන් යොදා ගන්නා ලද. පලවන රාජරාජන් චෝල රජු සංගීතයට සහ නර්තනයට ඉතාමත් ඇදුම් කළේය. ඔහු තම රාජධානියේ විවිධ ස්ථාන වල විසූ දක්ෂ දේවදාසීන් හාරසියයක් දෙනා එක් කොට, ඔහු විසින් ඉදිකළ තන්ජායි ප්‍රගතීස්වර දේවාලයේ දිව්‍යමය සේවාවන් සඳහා යොදා ගන්නා ලද. මෙම කාන්තාවන් "තල්ලිචේරි පෙන්ඩුගල් " ලෙස හැඳින් වූ අතර ඔවුන්ට කෝවිල අවට විදි වල, වාසස්ථාන පවරා දී ඇත. අනතුරව වියැකී ගිය නර්තන කලාව නගා සිටුවීම උදෙසා භරතනාට්‍යම් ඉගැන්වීමට ගුරුවරු දොළොස් දෙනෙක් පත්කර ගන්නා ලද. වාර්ෂිකව ඔවුන්ට වන්දි සහ දීමනා නිසි පරිදි ගෙවීම් කළ අතර, නර්තනයේදී දස්කම් දැක්වූ කාන්තාවන්ට "තලෙයිකොලි" උපහාරය ද, නර්තන ගුරුවරුන්ට කුත පයිරාරියන්, නිරුනා පයිරාරියන් , මාරයාන් යන උපහාර පිරිනමන ලදී. (Antony, History of Bharatanatyam, 2019)

නැටුම් ප්‍රසංගවලදී ගායනා කිරීමට සහ පරිවාර වාද්‍ය භාණ්ඩ වාදනය කිරීමට කලාකරුවන් පත් කර ඇති බවට ගල්-මූර්ති මගින් සනාථ වෙයි. (Antony, History of Bharatanatyam, 2019) කණිගයාර් කුලයෙන් උපන් 'මාධවී' නැටුම් කලාවේ දස්කම් දැක්වූ බවත්, භරතනාට්‍යම් නර්තන ශිල්පිනියකගෙ ප්‍රථම කැලළි මංගල්‍ය වන, ඇගේ අරංගේත්‍රුම් ප්‍රසංගය, කරිකාල් චෝල රජු ඉදිරියේ සිදු වූ බවත්, චෝල රාජ්‍ය සමයේ "තලකොලි " යන

නාමයත් , රන් කාසි 1008ක් තෑගි කළ බවත් සීලප්පදිකාරම් හි විස්තර වේ. (Antony, History of Bharatanatyam, 2019)

සීලප්පදිකාරම් ග්‍රන්ථයේ දැක්වෙන පරිදි චෝල රාජ්‍යයට අයත් සමුද්‍රාසන්න නගරයක අලුත විවාහ විවාහපත් පත් යුවළක් වන, කෝවලන් සහ කන්නගි නම් යුවළකි. ඔවුන් අතර පැවති ආදරය සහ බැඳීම දෙදරා යන්නේ, කෝවලන්ට හදිසියේ මුණ ගැසෙන මාධවී නැමැති නළඟන සමඟ අනියම් ඇසුරක් පවත්වා ගැනීමට පෙළඹෙන බැවිනි. තම බිරිඳ වන කන්නගිය හැර යන කෝවලන්, මාධවී සමඟ එක්ව සිටී. (×¡, 2023)

මිනිසුන්ගේ සමාජ ජීවිතය හා හුරු පුරුදු වෙනස් වීමත් සමඟම, කලාව ද වෙනස් වන්නට වීමත් සමඟ සාමාන්‍ය ජනතාව අතර පැවති කලාව, ආගමික උත්සව වලට ඇතුළත් කළහ. ආර්යයන්ගේ ආගමික චාරිතු වාරිතු ව්‍යාප්ත වෙමින් පවතිනවා සේම, ඒවාට පටහැනිව තමිල්නාඩුව තුළ බුදු දහම සහ ජෛන ආගම ව්‍යාප්ත වන්නට පටන් ගත්තේය. බුදු දහම සහ ජෛන ආගම; නිමක් නැති ආරවුල් , මත්වීමට, මස් කෑමට හා අශෝභන උත්සව වලට ඇබ්බැහිවීමට විරුද්ධ විය. එම ආගම් සාමය හා කාන්තාවන් ගෙන් වැළකි සිටීම හා මත්පැනින් මිදීම ඉගැන්වූ හෙයින් බුදු දහම සහ ජෛන ආගම ඉතා ශීඝ්‍රයෙන් මිනිසුන් අතර ව්‍යාප්ත විය. බුදු දහම සහ ජෛන ආගම මූලික වශයෙන් මිනිසාගේ සංවේදි හැඟීම් වලට ආකර්ෂණය වන නැටුම් හා සංගීත කලාවන්ට විරුද්ධ වූ නිසා මෙම කලාවේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීමට, උගත් මිනිසුන් එම කාල පරිච්ඡේදය තුළ නොමැති විය. එම නිසා මෙම අවධියේදී දේවදාසීන්ට ගණිකා වෘත්තියේ යෙදීමට සිදු වූ අතර, එහිදී මොවුන් රජවරුන්ට, ඉඩම් හිමියන්ට විකිණුනි. "කනීගස්" නැමැති ගණිකාව අතට මෙකී කලාව පත්වීමෙන් අනතුරුව ඈ තුළ තිබූ , භරත නාට්‍යම් පිළිබඳව ගායනයේ, නර්තනයේ සහ වාදනයේ, නිපුණත්වය, කුසලතාවය හේතු කොට ගෙන නැවත වරක් සමාජයේ ධනවත් පුද්ගලයන් අතරට හරතනාට්‍යම් කලාව ගෙන යාමට හැකි විය. (Antony, History of Bharatanatyam, 2019)

තුන්වන කුලෝත්තුංග චෝලයන්, දේවදාසීන් (200) දෙනෙකු "තිරුබුවන පදියිලර්" ලෙස නම්කර , ඔවුන්ව කාංචි අත්තියූර් අරුලාල පෙරුමාල් කෝවිලේ, පදිංචි කර නැටුම් හා සංගීතයට යොමු කළ බවට වාර්තා ඇත. (Antony, History of Bharatanatyam, 2019)

විජයනගර් රජ සමයේ දේවදාසීන්ගේ තත්ත්වය තරමක් ඉහළ මට්ටමක පැවතුණි. සහර්ජි රජු විසින් දිව්‍ය පෙරහර ආරම්භ වන සෑම සිකුරාදා දිනකම "පල්ලකී සේවා ප්‍රබෝධම්" නර්තනය පැවැත්වුණි. ඔහුගෙන් පසුව බලයට පත් වූ රජවරුන්, සර්ෆෝයී රජුද දේවදාසීන් ට නර්තනයේ ප්‍රවර්ධනයට දිරිගැන්වීම ලබා දුන්නේය. එහිදී සම්භාව්‍ය නර්තනයට අමතරව කුරවංජි , කිනිහි, වීදි නාට්‍ය, අශ්ව නැටුම, කෝලාටම් වර්ග (500) ආදී නැටුම් බිහිවිය. (Antony, History of Bharatanatyam, 2019)

"එහෙත් කුරවංජි නම් වූ නෘත්‍ය නාටක වලදී, දේවදාසියෝ සමුහ වශයෙන් රඟපෑමේ යෙදුනහ. තාන්ජාවූර්හි බෘහදීශ්වර දේවාලයේ ශේතු උත්සවයේ දී රඟ දක්වන ලද සාරාභේන්ද්‍ර භූපාල කුරවංජි නෘත්‍ය නාටකය එබඳු වූ කුරවංජි නාටකයකි." (fÊ', 2001)

පර්යේෂණයේ වැදගත්කම
මෙම පර්යේෂණයේ වැදගත්කම වන්නේ, භාරතීය සම්භාව්‍ය නර්තන ශෛලියක් වන හරත නාට්‍යම් නර්තන සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යනයේ නියැලෙන විද්‍යාර්ථීන්, පාසල් සිසුන් සහ හරතනාට්‍යම් නර්තනය හා එහි මූලාරම්භය පිළිබඳව අධ්‍යනය කිරීමට රුචිකත්වයක් දක්වන ඕනෑම අයෙකුට හා සම්භාව්‍ය ඉන්දියානු හරතනාට්‍යම් නර්තනය ආශ්‍රිත විභාග කටයුතුවල නියැලෙන විභාග අපේක්ෂකයන්ට, චෝල පල්ලව යුගයේ හරතනාට්‍යම් නර්තනයේ සිදු වූ ඓතිහාසික වර්ධනය පිළිබඳව හා චෝල පල්ලව යුගයේ දේවදාසීන් හරහා හරතනාට්‍යම් නර්තනයේ සිදු වූ වර්ධනය පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි වීම යි.

සමාලෝචනය
ශතවර්ෂ ගණනාවක් ඔස්සේ දිව යන සම්භාව්‍ය හරතනාට්‍යම් කලාව, බ්‍රහ්මගේ ආරාධනයකට අනුව හරතමුණිවරයා විසින් රචිත නාට්‍යශාස්ත්‍රයට අනුකූලව ගොඩ නැගී ඇති භාරතයේ සම්භාව්‍ය නර්තන කලාවකි. හරතනාට්‍යම් හි මූලාරම්භය සනිටුහන් කිරීමේදී, ශෛව හක්තිය ප්‍රමුඛ කොටගත් චෝල පල්ලවයන්ගේ අවධිය හරතනාට්‍යම් නර්තනයට සුවිශේෂී කාල පරිච්ඡේදයක් වූයේ, දේවදාසී සංකල්පය කේන්ද්‍ර කොට ගනිමින්, කෝවිල් දේවාල ඉදි කරමින්, චෝල පල්ලව රාජ්‍ය සමයේ වර්ධනයට භාජනය වීම කරණ කොට ගෙනය. සදිර් ආට්ටම්, දාසි ආට්ටම් ආදී වශයෙන් මූලාරම්භය සනිටුහන් කළ හරතනාට්‍යම් කලාවේ මුල බීජය දක්ෂිණ භාරතය පුරා ප්‍රචලිත කිරීමට චෝල පල්ලව පාලකයන්ගෙන් ලද නොමද දායකත්වය පිළිබඳව අධ්‍යනය කරන ලදී. පූජාර්ථය ප්‍රමුඛ කොටගෙන දේවාල ආශ්‍රිතව ප්‍රභවය ලද දාසි ආට්ටම් හි නියැලුනු කාන්තාවන් හෙවත්

දේවදාසීන් හට චෝල පල්ලව රාජ්‍ය සමයේ ලද රාජ්‍ය අනුග්‍රහය නිසාවෙන් කුල හීන කාන්තාවන් පමණක් නිරත වී දාසි ආට්ටම් නර්තනට , පසු කාලීනව ඉතා ජනප්‍රියත්වයට භාජනය වූ බවත්, දේවදාසීන් ලද වරප්‍රසාද පිළිබඳවත් මෙම පඤේෂණයේ දී අනාවරණය විය. දේවාලවල පූජාර්ථය පුමුබ කර ගනිමින් බිහි වූ හරතනාට්‍යම් නර්තනය සම්ප්‍රදාය , චෝල පල්ලව යුගයේ විවිධ රජවරුන්ගේ අනුග්‍රහයෙන් පෝෂණය වූ බවත්, අද්‍යතනයේ පවතින හරතනාට්‍යම් කෙරෙහි එම රජවරුන් ගොඩනගන ලද දේවාල ආශ්‍රිතව පවතින මූර්ති කැටයම් හි " කරණ" ඉරියව්වල ආභාශය ලැබී ඇති බවට වැඩිදුරටත් විග්‍රහ කළ හැක. එමෙන්ම මීට අමතරව චෝල පල්ලව අවදියේ සිටි පාලකයන්ගේ ප්‍රතිපත්ති නැටුම් පිළිවෙත්වලට බලපෑවේ කෙසේද යන්න පිළිබඳව වැඩිදුර පර්යේෂණ මගින් විමසා බැලිය හැකිය.

සාහිත්‍ය විමර්ෂණ

මෙම අද්‍යනයේ දී සාහිත්‍ය මූලශ්‍ර වශයෙන් පර්යේෂණයේ ග්‍රන්ථ ලෙස 'ඉන්දීය ශිෂ්ටාචාරය' (2,) 'ඉන්දීය නර්තන ලාලිත්‍ය', 'භාරතීය සම්භාව්‍ය නර්තන කලාව', 'ආසියාතික නාට්‍ය හා නර්තන කලාව', 'විශ්ව නර්තන', 'ඉන්දීය නර්තන සංස්කෘතිය', zDances of IndiaZ, zThe performing ArtsZ, zNatya VilasamZ යන කෘති පරිශීලනය කරන ලදී.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ෑ,ල m. (2023). *ඉන්දීය නර්තන සංස්කෘතිය.* දත්කොටුවට් වාසනා ප්‍රකාශකයෝ.

ටී., n. t. (2007). *ඉන්දීය ශිෂ්ටාචාරය (2).* ගොඩගේ ප්‍රකාශනග

Antony, V. (2019). *History of Bharatanatyam.* Thiruchirappalli: Kalai Kaviri College of Fine Arts.

Antony, V. (2019). *History of Bharatanatyam.* Tiruchirappalli: Kalai Kaviri College of Fine Arts.

ජේ., f. (2001). *භාරතීය සම්භාව්‍ය නර්තන කලාවග* බොරලැස්ගමුව.

හේර, (. t.,) යමුනා., a. (2004). *ඉන්දීය ශිෂ්ටාචාරය 2).*

හේර, n. t.,) යමුනා., a. (2004). *ඉන්දීය ශිෂ්ටාචාරය 2.*

Ganegoda, P. (2004). *Indeeya Narthana Lalithya.* Dehiwala: S. Godage & Brothers.

Juhi, T. (2021). Bgaratanatyam ; A Reflection of the Past and E ast and Evolving . *Digital Commons*, 1

M, K. F. (2012). A Study of the Early Vedic Age in AncientIndia. *Journal of Arts and Culture*, 132.

පී., .. (2004). *ඉන්දීය නර්තන ලාලිත්‍ය.*

Salimani, D. V. (2016). South Indian Administration during Chola Pallava Period. *International Journal of Scientific Research*, 533.

Sarabhai, M. (2000). *Understanding Bharatanatyam* (Seventh ed.). A Darpana Publication.

Shankar, S. (2021). The Devadasis, Dance Commiunity of South India : A Legal and Social Outlook. *International Journal on Minority and Group Rights*.

Srinivasan, S. (28th January, 2007). *The art and science of Indian (Chola) bronzes.*

NON-PROFESSIONAL SUBTITLING OF LOGICAL MECHANISMS IN HUMOUR OF THE COMEDY MOVIE *AIRPLANE*: A STUDY BASED ON THE GENERAL THEORY OF VERBAL HUMOUR

IM Ratnayake[1]

Abstract

ශ්‍රී ලංකාවේ ලේඛන කලාව පුස්කොළ මත ලිවීමේ ආරම්භය සනිටුහන් වන්නේ ක්‍රි.ව. 1 සියවසේ දී ය' මෙම ලේඛන කලාවේ අවසන් නිමැවුම වන්නේ පුස්කොළ පොත නිර්මාණය වීමයි. එසේ වුවද ඒවා පදම් කිරීමෙන් තොරව භාවිතයට ගත නොහැකිය' ඓතිහාසික දත්ත ඇසුරින් විමසා බලන විට පුස්කොළ ග්‍රන්ථ නිෂ්පාදන කලාව සඳහා යනු අති විශාල ලේඛන ප්‍රත්‍යුත්පාදන ක්‍රියාවලියක් වශයෙන් හඳුනාගත හැකි ව්‍යාපාරයක් වේ. පුස්කොළ සැකසීම සඳහා තල ගස තේරීමේ අවස්ථාවේ සිට පුස්කොළ ග්‍රන්ථය සකස් කර ගන්නාතෙක් අනුගමනය කෙරෙන ක්‍රියාවලිය තෙක් නොයෙක් විශේෂ වූ පුද්සිරිත් අනුගමනය කරයි' කෙසේ වුවත් පුස්කොළ පොත් කර්මාන්තය තුළ භාවිතා කෙරෙන්නා වූ විවිධ තාක්ෂණික පදමාලාව සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණයන් හෝ කතිකවට අදාළ ලිපි ලේඛණ සොයා ගැනීමට නොහැකිය, මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වන්නේ පුස්කොළ පොත් කර්මාන්තය තුළ භාවිත පාරිභාෂික ශබ්ද මාලාවත් එනම් පුස්කොළ පොත ලේඛනය සඳහා සකසා ගැනීමේ ක්‍රියාවලියේ සිට එහි ලිවීම දක්වා යෙදෙන පාරිභාෂික ශබ්ද මාලාව හා එයට අදාළ අර්ථ විවරණයන් සම්බන්ධයෙන් කරුණු ගොනු කර දැක්වීමයි. මේ සඳහා භාවිත පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදයයි. මේ ඇසුරින් දැනට පළ වී ඇති ලිපි, සමීක්ෂණ වාර්තා, පර්යේෂණ පත්‍රිකා මෙන්ම වැඩමුළු සම්බන්ධ වාර්තා භාවිත කෙරේ' එහි භාවිත සමහර ව්‍යවහාරයන් බුදු දහමේ පැනෙන හරයන් හා සමග වඩාත් සමීප සබඳතාවක් මෙන්ම එයින් නිපන් අර්ථයක් දෙන බව වැටහේ. මෙම පර්යේෂණය මඟින් මෙහි යෙදෙන පද සම්බන්ධයෙන් ඉතා පැහැදිලි අර්ථ විවරණ සැපයීම හේතුවෙන් එම වචනාර්ථයන්හි ඇති අපැහැදිලි තැන් නිදොස් කිරීමට උත්සාහ කිරීම හේතුවෙන් ඒවා වඩාත් පහසුවෙන් අවබෝධ කර ගැනීමට උපකාරී වේ. එමඟින් මෙතෙක් කලක් කතිකාවට බඳුන් නොවූ වැදගත් ඓතිහාසික කරුණු සම්බන්ධයෙන් හෙලිදරව් කරගත හැකි වන අතර එය ලංකා ඉතිහාසයේ පුස්කොළ නිෂ්පාදන කර්මාන්තය ආශ්‍රිතව තිබූ ඉතා හරවත් මෙන්ම වැදගත් භාෂාමය රටාවක් පහසුවෙන් අවබෝධ කර ගැනීමට උපකාර වනවා ඇත.

ප්‍රමුබ පද : පදරුත්, පුස්කොළ පොත්, පාරිභාෂික පද, ශ්‍රී ලංකාව

හැඳින්වීම

මනුෂ්‍ය සංහතියේ ආරම්භයේ සිටම භාෂා ව්‍යවහාරයක් පැවතිය ද ඔවුන්ට අදාළ ලේඛන සටහන් බිහිවූයේ ඊට බොහෝ කාලයකට පසුව බව පසුකාලීනව සිදුකළ පර්යේෂණ ඇසුරින් භාෂා විශාරදයින් හා වාග් විද්‍යාඥයින් විසින් පිළිගත් මතය විය. එසේ හෙයින් මුල් කාලීනව සාමාජිකධාරීන් විසින් රැගෙන ආ මෙම ව්‍යවහාර භාෂාව පසුකාලීන වන විට ඒවා ලේඛනගත කොට ඉදිරි පරම්පරාවට රැගෙන යාමට ගත් උත්සාහයක ප්‍රතිඵලයක් වශයෙන් ලේඛන කලාව බිහිවන්නට ඇති බව පුරාවිද්‍යාඥයින්ගේ මතයයි. ඒ බවට හමුවන ඓතිහාසික සාධක වන්නේ ලෙන් සිතුවම් සහ පුරාවිද්‍යාත්මක ලේඛනයන් ය. (සෝරත, 2014)

ඒ කෙසේ වුවද, ලංකාව ඇසුරින් අධ්‍යයනයන්හි යෙදෙන කල ලේඛනය හෙවත් කිසියම් කරුණක් හෝ කරුණු සමුදායයන් ලේඛගත කොට පවත්වාගෙන යාම සඳහා භාවිත කර ඇති පැරණි මාධ්‍යයන් අතර ශාබමය ද්‍රව්‍යයන්ට හිමි වූයේ සුවිශේෂ ස්ථානයකි. ඒ අතර ලේඛනය සඳහා භාවිතා කළ තාල වර්ගයට අයත් පත්‍ර විශේෂයක් පවති. එයිනුදු ලංකාවේ ලේඛනය සඳහා භාවිතා කළ තාල වර්ගයට අයත් ශාක වර්ග දෙකක් හඳුනාගත හැකිය. ːෲසකඩ්ඩ 1938*ග එනම් තල හා තල් වශයෙනි. තල් වර්ගයට අයත් උද්හිත නාමය වූයේ ːඌද්‍රීම් ක්ඃඣැකසඣෲ බග* යන අතර අකුරු ලිවීම සඳහා භාවිතා කළ තාල වර්ගය ːඃරහවඃ ඔපඉරඃජමකසඣෲ බග* වශයෙන් හඳුනා ගනී. තල කොළ ලේඛනය සඳහා භාවිතා කිරීමේ හේතුව වශයෙන් දක්වා ඇත්තේ තල කොළවලට සාපේක්ෂව තල් කොළ අධික ජීතලට සහ අධික උෂ්ණත්වයට ඔරොත්තු වීමේ හැකියාව පහළ මට්ටමක පවතින බැවින් හා තල් පැවැත්ම ද අඩු බවය. (රත්නායක, 2019)

කෙසේ වුවද ලේඛනය සඳහා භාවිතා වන්නට ඇත්තේ තල කොළය බව පර්යේෂණ විද්වතුන්ගේ අදහසයි. (ලගමුව, 2006 ; ෲසකඩ්, 1938* තල කුලයකට අයත් මෙම ශාකය පදනම් කරගෙන පක්ෂින් මාර්ගයෙන් බොහෝ පණිවුඩ යැවීමත් සිදු වූ බව පැරණි බෞද්ධ සාහිත්‍යයට අයත් ග්‍රන්ථ අධ්‍යයනයේදී පෙනී යන කරුණකි. මෙසේ පුස්කොළ හෙවත් තල කොළවල ලේඛනය සිදුකළ අවට තොරතුරු ක්‍රි. පූ. 6 වන සියවසේ සිට පැවැති බවට සාධක හමුවේ. (ධම්මික හිමි, 2019 ; පරණවිතාන, 1996). ඒ කෙසේ වුවද ක්‍රිස්තු පූර්ව සහ

ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ බවට සාධක හමුවේ. එමෙන්ම එම කාර්තව්‍යය මාතලේ අළු විහාරයේ සිදු කර ඇත්තේ ද තල කොළ මත බව ද, ලංකාවේ ලේඛන කලාව බිහිවීම පිළිබඳ ඉතිහාසය තුළ එය වැදගත් සන්ධිස්ථානයක් වූ බවද ලේඛන ඉතිහාසයෙන් හමුවන සාධක වේ.

මෙසේ ඈරඹි ලෙස කලාව තුළ මෙම ලිපිය මගින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වනුයේ පුස්කොළ ලේඛන කර්මාන්තය තුළ භාවිත භාෂාව සම්බන්ධයෙන් හා එයටම ආවේණික වූ පාරිභාෂික ශබ්ද හෙවත් පාරිභාෂික පද මොනවාදැයි යන්න හඳුනා ගැනීමත් ඒ්වාහි භාවිතය හා පදරුත් සම්බන්ධයෙන් විග්‍රයක යෙදීමත්‍ය. මෙම විමර්ශනයේදී ලාංකේය පුස්කොළ පොත් කර්මාන්තය හා ඒ හා සම්බන්ධයෙන් භාවිත පද කෙරෙහි විශේෂ අවධානය යොමු කරන අතර එම කර්මාන්තයට ආවේණික පද සම්බන්ධයෙන් වැඩිදුර කරුණු විමර්ශනය කෙරේ. එසේම විග්‍රහයේ දී පවත්වාගෙන යනු ලබන පිළිවෙල වන්නේ පුස්කොළ පොත නිර්මාණයේ මුල් අදියරෙහි සිට අවසන් අදියර දක්වා වේ.

පර්යේෂණ ක්‍රමවේදය

මේ සඳහා භාවිත පදමාලාව හා පදාර්ගතය සම්බන්ධයෙන් සොයා බැලීමටත්, එහි අර්ථ නිරූපණය නිවැරදිව හා ක්‍රමවත්ව භාවිතා කර ඇති ආකාරයට විමර්ශනයට ලක් කිරීමත් සඳහා මේ සම්බන්ධයෙන් පර්යේෂණයට ලක් කර ඇති ලිපි ලේඛන මෙන්ම ලියවී ඇති පොතපත ද, ශාස්ත්‍රීය ලිපි හා අනෙකුත් ඓතිහාසික ලේඛනයන් පරිශීලනයට ලක් කරන ලදි. ඒ අනුව මෙම ලිපිය සඳහා භාවිත පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ සන්ධාර පර්යේෂණ ක්‍රමවේදයයි. මෙහිදී කතිකාවට භාජනය වන ප්‍රස්තුතය කෙරෙහි ඉදිරිපත්ව ඇති අදහස් හා විවරණයන් තුළින් අදාල කර්මාන්තය හා බැඳි පැවතියා වූ ශබ්ද මාලාව විග්‍රහයට ලක් කරන අතර මෙතෙක් කලක් මෙම පුස්කොළ ප්‍රත්‍යුත්පාදන ව්‍යාපාරය හා බැඳි පැවති වූ භාෂා ශක්‍යතාව විදහා දැක්වීමත් එසේම පැරණි හා නුතන සාක්ෂි ඇසුරින් මෙම ක්ෂේත්‍රයෙහි අධ්‍යයනය සඳහා පවතින හිඩැස සම්පූර්ණ කිරීමටත් මෙය මහඟු පිටුවහලක් වනු ඇත.

පුස්කොළලේඛන කලාව

පුස්කොළ ලේඛන කලාව හා ආශ්‍රිතව වර්ධනය වූ ලේඛන ශෛලිය හා ශිල්ප ක්‍රම මෙන්ම මෙම කර්මාන්ත හා බැඳි පැවතියා වූ භාෂාව හෙවත් ශබ්ද මාලාව සම්බන්ධයෙන් විශේෂ අධ්‍යයනයක් සිදුකළ යුතු වන්නේ එය ඒ පමණට දියුණු වූ හා වර්ධනය වුණු ලේඛන පිටපත් කිරීමේ හා උත්පාදනය කිරීමේ දියුණුව පැවති ව්‍යාපාරයක් වූ හෙයිනි. මේ සම්බන්ධයෙන් වැඩිදුර කරුණු විමසා බලන කල්හි මේ සඳහා යොදාගත් භාෂාවත් එමෙන්ම ශිල්ප ක්‍රම හා එයටම උරුම වූ ලේඛන ශෛලියක් සංවර්ධනය වී ඇති හෙයින් ඒ පිළිබඳ මෙහිදී සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් කිරීම වඩාත් උචිත වේ.

ඒ අනුව මෙහිදී ඉගෙනීමේ හා කියවීමේ පහසුව සඳහා පුස්කොළ සැකසීම සඳහා තල ගස තේරීමේ අවස්ථාවේ සිට තල ගොබය කපා එය ශුද්ධ පවිත්‍ර කර ගන්නාතෙක් අනුගමනය කෙරෙන ක්‍රියාවලියෙහිදී භාවිත පාරිභාෂික ශබ්ද මාලාවත් එතැන් සිට දෙවනුව පුස්කොළ පොත ලේඛනය සඳහා සකසා ගැනීමේ ක්‍රියාවලියේ සිට ලිවීම දක්වා යෙදෙන ශබ්ද මාලාවත් ඉන් අනතුරුව පුස්කොළ පොත ගබඩාව සඳහා සුදානම් කිරීම සඳහා භාවිත ශබ්ද මාලාවත් වශයෙන් අදියර කිහිපයක් ඔස්සේ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වේ.

තල ගොබය ලකුණු කිරීම සහ තල කුරු ඉවත් කිරීම

මෙම කර්තව්‍ය සඳහා අදියර කීපයක් අනුගමනය කිරීමට සිදුව ඇත. ඉහතින් සඳහන් කළ තාල වර්ගයට අයත් (Corypha Umbraculifera L.) යන උද්භිත නාමය හිමි ශාඛයෙහි ගෙඩි හට නොගනී. එමෙන්ම මෙය ලංකාව තුළ මධ්‍යම පළාතේ යම් යම් ප්‍රදේශවල මෙන්ම වෙරළාසන්න තෙත් කලාපයෙහි හොඳින් වර්ධනය වන ගසකි. උස අඩි 20 සිට 80 දක්වා උසට වර්ධනය වේ. මේ අනුව ප්‍රථම කාර්යය වන්නේ තල ගසක් වෙන් කර ගැනීමයි. එනම් තල ගොබය විවිධ කාර්යයන් සඳහා යොදාගන්නා බැවින් එය ඉදුල් වීම වලකා සද්කාර්යය සඳහා වෙන්කර ගැනීමයි. එමගින් එම ගස වෙනත් කාර්යයක් සඳහා භාවිතයට නොගන්නා අතර ලේඛනයට අවශ්‍ය පත්‍ර ලබා ගැනීම සඳහා පමණක්ම වෙන් කරන ලද ගසක් වශයෙන් ආරක්ෂා කර ගනී. මෙය මෙම ව්‍යවහාරය තුළ සඳහන් කෙරෙනුයේ ''තල ගස සලකුණු කිරීම'' යනුවෙනි. අනතුරුව මෙම ගසෙහි දිග හැරුණු සියලු තල කොළවලට මධ්‍යයෙන් අලුතින් වැවෙන තල කොළ ''තල ගොබය'' නමින් හඳුන්වා ගනී. (ධම්මික හිමි, 2019). මෙය ලා පැහැති ගොබයක් වන අතර එය පීදීමට පෙර මෙම ගොබයට උණ පතුරුවලින් වළලු දමා පීදීම වැලක්වමින් මෙම ගොබය තල කොළ ලබාගැනීම සඳහා යොදා ගනී. මෙය ඉහළ අහසට ලම්බව ඇති බැවින් හානියකින් තොරව පදමට මෝරා ඇති සාරවත් මෙන්ම ගුණාත්මක ශාකපත්‍ර ලබා ගැනීමට හැකියාවක් ඇත.

අනතුරුව මෙසේ ගොබයට වළලු යොදා ගොබය කැපීමට සුදුසු කාලයේදී එනම් කැපුම් දිනයේදී ගොබයේ කැපීමට පෙර කැපුම් ස්ථානයට පෙරකැපුම් සලකුණක් යෙදිය යුතුය. මෙය ''කට්ටයක් කැපීම'' ලෙස

ව්‍යවහාරයෙහි පවතී (ධම්මරතන හිමි, 2019). මෙසේ කට්ටයක් කැපීමෙන් අනතුරුව තල ගොබය කපා ඉන් අනතුරුව එම ගොබය ලණුවක ගැටගසා පුහුණු අයෙකු ලවා ඉතාමත් ප්‍රවේශමෙන් හා සීරුවෙන් එම ගොබය තල අතුවල නොගැටෙන ආකාරයෙන් ඉතා ප්‍රවේශමෙන් ඉහළ සිට පහළට රැගෙන ආ යුතුවේ. මෙය බිමට පතිත නොවන්නට වග බලා ගත යුතු අතර සුරැකිව අල්ලා විසිරී නොයන පරිද්දෙන් ප්‍රවේශම් සහිතව අවශ්‍ය ස්ථානය කරා මිනිස් කර මතින් රැගෙන ආ යුතුවේ.

ඉරටු / තල කුරු ඉවත් කිරීම

මෙහිදී එයටම විශේෂයෙන් සැකසූ උපකරණ භාවිතයෙන් තලකුරු ප්‍රවේශමෙන් ඉවත් කර ගත යුතු ය. කපාගත් තල ගොබය පිස දමා පිරිසිදු එමෙන්ම විශාල මාගලක එලා ගැනීමෙන් අනතුරුව මෙම කුරු ඉවත් කිරීම ආරම්භ කෙරේ. සඳහා කෙටි පිහිතල කිහිපයක් සහිත උපකරණයක් ඇති අතර එහි තලකුරු ඉවත් කිරීම සඳහා ද නොකැපෙන එහෙත් සිහින් උලක් සහිත වූ තලයක් ද එම පිහිතල සමග එකතු කොට කොපුවකට ඇතුල් කර ගත් උපකරණයක් සාදා ගෙන ඇත. මෙම උපකරණය භාවිතයෙන් ''පිට ඉරටුව හා බඩ ඉරටුව'' යන දෙකම ඉවත් කෙරේ. එසේ කිරීමේදී කොළයට හානි නොවන ලෙස ඉතා ප්‍රවේශමෙන් ඉරටුව වෙන්කර ගතයුතු වේ. අනතුරුව තල කොළයේ අග්ගිස්සේ සිදුරක් කපා ගනී. පිහි තලය ආධාරයෙන් මෙම කැපුම යොදන අතර එය කපා ගන්නේ ඩ් හැඩයක් වශයෙන්. එලෙස කැපුම් දෙකක් යොදා ගනිමින් (එවිට අඳවා කැටයක හැඩය) තල කොළ සියල්ල සකස් කර ගැනේ (ධම්මරතන හිමි, 2019).

කර කොළය

තල ගොබයෙන් කුරු ඉවත් කළ පසු එමගින් තල කොළ ලබා ගත හැකි වේ. මෙසේ ලබාගත් තල කොළ එනම් පියවි තල කොළ ''කරකොළ'' නමින් හැඳින්වේ. මෙම කරකොළ පුස්කොළ ලිවීම සඳහා ඉගෙන ගන්නා ආධුනිකයන් විසින් භාවිත කරනු ලබයි. තවද කෙටිකාලීන වටිනාකමකින් යුත් ඔප්පු වැනි ඉඩම් ලේඛන සහ පුද්ගලයින් අතර ලිපි හුවමාරු කර ගැනීම සඳහා ඉරටුව සහිත මෙම කරකොළ යොදාගනු ලබයි. (හැක්කල 1932). මෙම කර කොළ බොහෝ විට පදම් නොකිරීම හේතුවෙන් ක්‍රිමීන්ගෙන් හානි සිදුවන අතර වැඩි කාලයක් පවත්වා ගත නොහැකි ය. මෙසේ පදම් නොකළ හා අමු කරකොළ අක්ෂර ලිවීමට ඉගෙන ගන්නා ආධුනිකයන්ගේ ප්‍රයෝජන පිණිස මූලික පුහුණුවක් ලබාගන්නා අයවලුන් විසින් භාවිතයට ගන්නා බැවින් කල් පැවැතීම සීමා සහිත වේ (එඩ්මන්ඩ්, 1996).

වට්ටු සාදා ගැනීම

මෙහි දී සිදුවන්නේ ඉරටු ඉවත් කරගත් තල කොළ කිසියම් පිළිවෙළකට හකුලා ගැනීම හෙවත් පුරුද්දා ගැනීමයි. එක් වට්ටුවක් සකසා ගැනීම සඳහා තල කොළ 15 - 20 ක් එතිය හැකිය. එවිට එය දරණුවක් ආකාරයෙන් දිස්වනු ඇත. මෙම වට්ටු විසිරී යා හැකි බැවින් තල කොළවලින් ඉවත්කළ ඉරටු ආධාරයෙන් ඒවා හොඳින් බැඳ ගත යුතුය. එවිට මෙය තල කොළ රෝලක් මෙන් සාදාගත හැකිය. මෙම තල කොළ මෙසේ ''වට්ටු'' ලෙස සාදාගනු ලබන්නේ තම්බා ගැනීම සඳහාය. මෙසේ පුරුද්දා ගනිමින් වට්ටු විශාල ප්‍රමාණයක් සාදාගත හැකිවේ. එමගින් මෙම කොළය දිග කාලයක් පවත්වා ගත හැකි ගුණයක් ඇතුළත් වේ. මෙය විෂ්කම්භය අඩියක් පමණ වන සේ රවුම්වලට ඔතා ගත හැකි වේ (එඩ්මන්ඩ්, 1996). වට්ටු ගැසීමෙන් තල කොළයේ උස් පහත් තැන් සම වී ඇඳ කුද නැතිව් යෑමෙන් සමතුලිත මතුපිටක් හෙවත් ලිවීමට සුදුසු පෘෂ්ඨයක් ලබාගනී. මෙම වට්ටු නැමති ව්‍යවහාරය තල කොළ නිෂ්පාදන කර්මාන්තයේදී හමුවන සුවිශේෂී ව්‍යවහාරයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. අනතුරුව නොයෙක් කොළ වර්ග හා ඖෂධ වර්ග එකතු කර ගනිමින් විශාල තඹ හැලියක අහුරා මෙහා නොයන ලෙස තබා තම්බා ගනී. මේ සඳහා පැපොල් කොළ, පැපොල් ගෙඩි, අන්නාසි ගොබ, කැප්පෙටියා කොළ ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගනී. සමහර අවස්ථාවලදී බිලිං කොළ, බෝශු කොළ, මෙන්ම පිරිසිදු ජලය මේ සඳහා යොදා ගනිමින් තැම්බීමේ කාර්යය සිදුකර ගනු ලැබේ (De Silva, 1938).

කොළ වැළ

මෙසේ ජලයේ බහා තම්බා ගත් කොළ ලිහා මඳ අව්වේ වියලා ගැනීමට අවශ්‍ය වේ. මේ සඳහා වැළක් සකසා ගත යුතු වේ. මෙම වැළ පුස්කොළ කර්මාන්තයේදී හඳුන්වනු ලබන්නේ ''කොළ වැළ'' නමිනි. මෙයද පුස්කොළ පොත් නිෂ්පාදන කර්මාන්තයෙහිදී යේදී ඇති වචනයක් ලෙස හඳුනාගත හැකිය. මේ සඳහා එනම් කොළ වැළ සාදාගැනීම සඳහා ඉවාත් කළ ඉරටු භාවිතයට ගැනේ. එනම් තල කොළ එකිනෙකට පුරුද්දා බැඳ ගැනීම උදෙසා තල කොළයේ අග්ගිස්සේ විදින ලද සිදුර භාවිතයට ගනී. තම්බාගත් තලකොළ ඉරටු දිගේ අමුණා ගනිමින් කොළ වැළක් සාදා ගනී. මෙය මඳ පවනේ වේලා ගැනීම අවශ්‍ය වන අතර ඒ සඳහා මෙම කොළ වැළ ගැටගසා ගනිමින් පවනේ වේලා ගත යුතුවේ.

පුස්කොළ

පුස්කොළ යනු විශේෂිත නාමයකි. එහෙත් මෙයින් අදහස් වන්නේ කුමක්දැයි යන්න විග්‍රහ කර බැලීම සුදුසුය. මේ සම්බන්ධයෙන් නොයෙක් දෙනා නොයෙක් අදහස් හා අර්ථ විවරණ සපයා දී ඇත. ඒ අතර ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයට අනුව ''පුස්'' යන්නෙහි අරුත ''කිසිවක් නොලියූ හිස් කළ කොලය'' යන අරුත් දෙයි. ඒ අනුව මෙහි ''පුස්'' යනු ''හිස්'' යන අරුත දේ. එසේම ''හිස්'' යන ''පුහු'' යන නාම පදයක් ද වේ. එසේම ''පුස්'' යනු (පිසීමෙහි) සකර්මක ධාතුවකි. එහි අරුත ''පිසීම'' (ආහාර) හා අනෙක් අනෙක් අරුත ''පිස දැමීම'' යන ක්‍රියාවයි. ඒ අනුව පිස දැමූ, පිරිසිදු කොටගත්, පිසූ (තැම්බූ) යන අරුත් ඇති පුස් - ධාතුව ම පුස්කොළ යන පදයේ මුල් ශබ්දය වන්නට ඇති බව කුලසූරිය (1996) මතයයි. එහෙත් ශ්‍රී සුමංගල ශබ්ද කෝෂාර්ථයෙන් ගත්විට පුහු කොළය පුස් කොළය වන්නට ඇති. ඒ අනුව ''පුස්'' යන්නෙහි අරුත ''හිස්'' යනු විය හැකිය. එබැවින් ''පුස්කොළ'' යන්නද වචන කිසිවක් නොලියූ හෙවත් ''ලියා නොමැති තල කොළය'' යන අරුත් ගන්වයි. එහෙත් අද වන විට ''පුස්කොළය'' යන්න භාවිතයෙහි යෙදි ඇත්තේ ''ලියන ලද පුස්කොළ පොත්'' හැඳින්වීම සඳහා පොදුවේ ව්‍යවහාර වන පදයක් ලෙසිනි.

ඒ අනුව තල ගොබය කපා ගත් පසුව එය සැකසීමේ ක්‍රියාවලියෙහි අවස්ථා කිහිපයක් පසු කළ විට එයින් පුස්කොළ ලබා ගනී. අනතුරුව තල කොළ එකතු කොට මෙය නොලියූ පොතක් ලෙස සාදාගත් පසු හෙවත්, එනම් ලියා නොමැති තල කොළ එකතුකර එකට බඳින ලද පුස්කොළ මිටිය හඳුන්වනු ලබන්නේ ''පොත් ගෙඩිය'' වශයෙන්. එසේම මෙයට ''පුස් ගෙඩිය'' යන නාම ද භාවිත වේ (ධම්මික හිමි, 2019 ; ධම්මරතන, 2019 ; කුලසූරිය, 1996).

''පඩි ගල'' හෙවත් කොළ මැදීම

වේලා ගත් තල කොළ සඳහා මනා නිමාවක් හෙවත් ලිවීමට සුදුසු පෘෂ්ධයක් ලැබෙන පරිද්දෙන් මෙලෙස තල කොළය මතුපිට සුමට ලෙස සකසා ගැනීම කළ යුතුවේ. ඒ අනුව පින්නෙහි ලා ගත් තල කොළය වේලා ගත් පසු ලේඛනයට යෝග්‍ය වන්නේ ඒවා මැද ගැනීමෙනි. මෙසේ මැද ගැනීම සඳහා පුවක් ගස් හෝ මෝල්ගස් ආදිය යොදා ගනී (ඈසකඩ්ඩ 1938 ; ඈසකඩ්ඩ 1969). මෙම ලී දඬුව හරස් අතට රුවා ගනිමින් තල කොළයේ අගට යොදාගත් සිදුරට ගලක් එල්ලා මෙම මෝල් ගස හෝ පුවක් ගසේ කඳ මත ඇතිල්ලමෙන් කොලය සුමට බවක් ලබා දේ. එපමණක් ද නොව සමහර පළාත්වල මැදීම සඳහා ගලක් යොදා ගනී. එය හඳුන්වා ඇත්තේ ''පඩිගල'' යනුවෙනි :ඪසනීල 1985*. මෙලෙස කොළ ඇතිල්ලීමෙන් මැද ගැනීමට භාවිතා කරන පුවක් ගස හඳුන්වනු ලබන්නේ ''හේම කඳ'' යනුවෙනි (එඩ්මන්ඩ්, 1996).

සිදුරු කැපීම

සිදුරු කැපීම සිදු කරනු ලබන්නේ පුස්කොළ පොත කැපිය යුතු ප්‍රමාණයට අවශ්‍ය ලී අච්චු භාවිත කිරීමෙනි. එමගින් අච්චුවේ සිදුරුද තල කොළයේ නූල රඳවන සිදුර ද එකවර විදගත හැකිය. මෙම සිදුරු විද ගැනීම කරන්නේ තල කොළය අවශ්‍ය දිගප්‍රමාණයට කපාගත් පසුව, මෙම කොළය තුනට නවා දිග හැර නැවත එම කොළය හතරට නවා එම නැවුම් දෙකක් අතරින් සිදුරු විදගැනීමෙනි. ඒ සඳහා පුස්කොළ පොත් කර්මාන්තය තුළ භාවිත වචනය වන්නේ ''සුළි කැපීම'' යනුවෙනි. එසේම එම සිදුරු විද ගැනීම කරනු ලබන්නේ ''සුළි කටුව'' ආධාරයෙනි. එවිට එසේ ඉවත්ව යන රවුම් කෑබලි හෙවත් කෑපී ඉවත්වන කැබලි හඳුන්වනු ලබන්නේ ''කරස්'' යනුවෙනි. (හැකක, 1932)

කොළ කැපීම

අච්චුවෙහි ලා ගත් කොළ අච්චුවෙහි ප්‍රමාණයට කපාගනු ලබන්නේ පොත් කැත්ත භාවිතයෙනි

රත ගෑම

අනතුරුව ''රත ගෑම'' නම් ක්‍රියාවක් සිදුකරයි. මේ නමින් හඳුන්වනු ලබන්නේ යකඩ පත්තක් වැනි උපකරණයකටය. ගිනියම් කරන ලද මෙම යකඩ පත්ත පුස්කොළ අච්චුවෙයි සිටු පැත්ත හොඳින් ස්පර්ශ කරමින් ඇතිල්ලු විට කොන්වල ඇති කෙඳි සහ අනවශ්‍ය නූල් වැනි කොටස් දැවී දුමක් නිකුත් වීමයි. එමගින් තල කොළයට අලංකාර බවක් මෙන්ම පිළිවෙළක් හෙවත් හොඳ නිමාවක් ලැබෙයි (ධම්මික හිමි, 2019 ; ධම්මරතන හිමි 2019 ; ඇල්ලේපොල, 2007). මෙම පුස්කොළ පොත් නිෂ්පාදන කර්මාන්තය තුළ මෙය ''රත ගෑම'' වශයෙන් හඳුන්වනු ලැබේ. මේ සඳහා භාවිතා කරනු ලබන පත්තක් වැනි උපකරණය ''පත්තුල'' නම්. (ධම්මරතන හිමි, 2019) තවද මෙසේ රත ගෑම මගින් මෙම පොත් තුලට ගුල්ලන් හෙවත් එසේම හානි පැමිණිය හැකි සතුන්ට ඇතුළ්වීමට නොහැකි වන අතර පොත්වල නිමාවත් මනා ආරක්ෂාවත් සැලසේ. මෙම රත ගෑමෙහි අවස්ථා දෙකක් ඇත.

1. පොතේ හතර පැත්තේ රත ගෑම
2. සුළි හෙවත් සිදුරු රත ගෑම වශයෙනි.

සුළි සඳහා එකි ප්‍රමාණයට මහත යකඩ කුරක් රත් කොට සිදුරු අතරින් යවා පුළුස්සා ගැනීමයි. එමගින් පරිසරයේ ඇති ජල ජල වාෂ්පවලින් පවා ආරක්ෂා වී හොඳ නිමාවක් ලබා දේ. මෙය පැතිලි තලයක් හා දිගු මිටක් සහිත උපකරණයකි.

මෙසේ සකසාගත් පුස්කොළ ග්‍රන්ථය සඳහා යෙදෙන නාමය වන්නේ ''පොත් ගෙඩිය'' හෙවත් ''පුහු පොත් ගෙඩිය'' වේ. එමෙන්ම මෙහි ඇති එක් පුස්කොළයක් සඳහා යෙදෙන නාමය වන්නේ ''පත් ඉරුව'' නම් (ඪඞ්සීල 1947).

පොත් ගෙඩිය
මූලික වශයෙන් පුස්කොළ පොත් සකස් කර ඉක්බිති ඒවා පොත් කෑත්තෙන් සුදුසු පරිදි කපා එහි සුළි විද, රත ගා, අච්චුවෙන් ගලවා ගෙන ''පොත් ගෙඩි'' සකස් කරනු ලැබේ. ඒ අනුව අකුරු නොලියූ පොත් ගෙඩිය ''පුස් ගෙඩිය'' යන නමින් හඳුන්වනු ලැබේ. ඉනුත් පත්තිරුවලට අකාරාදි පිළිවෙළට අකුරු යොදා කොළ අටක් හෝ සොළොසක් එක්කළ මිටියක් හඳුන්වනු ලබන නාමය වන්නේ ''පත් කට්ටුව'' ලෙස යි.

පොත් වහන්සේ
පුස්කොළ පොතක් අංග සම්පූර්ණ වන්නේ එහි අකුරු ලිවීමෙන් පසුවය. එසේ වූ පසු මෙයට ගෞරව නාමයක් ද එක් කෙරේ. මෙය බොහෝ විට හඳුන්වනු ලබන්නේ ධර්ම ග්‍රන්ථ සඳහා හෙවත් ධර්මය එසේ පිටපත් කළ ග්‍රන්ථ සඳහා යෙදෙන නාමයක් වශයෙනි. ප්‍රාණවාචී බවක් ආරෝපනය කළ වචනයක් ලෙස හා එයට ගෞරව වශයෙන් ''පුස් කොළ පොත් වහන්සේ'' නමින් ද පදරුක් වේ. සියළු ත්‍රිපිටකය ලිවීමෙන් අනතුරුව එය බුදුරදුන්ට සම කරමින් හා බුදුන් දෙසු ධර්ම දේශනාවන්ට අණුරූප වන හෙයින් ''පොත් වහන්සේ'' යන නම ඊට ගෞරව නාමයක් ලෙස ව්‍යවහාරව පවතී. ඒ කේසේ වුවද මෙ අදහස තවත් තීවු කරමින් අරිසන් අහුබුදු ශූරීන් මෙය විග්‍රහ කොට ඇත්තේ ''මේ තල කොළෙහි මුලින් බුදු දහම ලියවුණෙන් එම පත් පුදට (පූජාවට) නිසි වී.

පුදට නිසි කොළ ► පුද ලද කොළ ''පුද කොළ'' පුද කොළ ► පුත් කොළ ► පුස් කොළ යි ගත් හමස් විම මෙසේ සන්ධි නියරෙකි යනුවෙනි (අහුබුදු, 2000).

පන්හිද
තල ඉරුවේ හෙවත් පත් ඉරුවේ ලිවීම සඳහා භාවිතා කළ උපරණය පන්හිදයි. එනම් සියුම් තුඩක් සහිත පෑනක් මෙනි. මෙහිදී සිදු වන්නේ තල කොළ පෘෂ්ධයෙහි සිරීමක් කරනු ලැබීමයි. එසේ සිදු කෙරෙනුයේ පන්හිද අගිස්සෙහි ඇති තියුණු වානේ තුඩ මගිනි. මෙම පන්හිද කිසියම් ක්‍රමයකට අගිස්සෙහි ඇති තියුණු වානේ තුඩ මගිනි. මෙම පන්හිද කිසියම් ක්‍රමයකට හෙවත් ප්‍රමිතියකට තැනූ උපකරණයකි. පන්හිද භාවිතය සඳහා මනා පුහුණුවක්, සංගයමයක් මෙන්ම අවබෝධයක් තිබිය යුතුය. මෙයින් සිදු කෙරෙනුයේ අකුරු කටු ගෑමයි. (ඇ ‍ිසකඩ්ල 1947). අද මෙන් එදවසත් මෙම පන්හිද දකුණු අතේ රඳවා ගෙන අකුරු කළ බව සඳහන් ය. (වික්‍රමරත්න, 1967)

උල් කටුව
උල් කටුව යනු පන්හිද භාවිතය හුරු වීමට ප්‍රථම ආධුනිකයන් විසින් අකුරු පුහුණු වීමට ගන්නා උපකරණයයි. මේ ඇසුරින් ලිවීම පුහුණු වූ පසුව පන්හිද භාවිතයට ගනු ලබයි. ගුරුවයා විසින් ශිෂ්‍යායාට පුස්කොළ ලේඛනය සඳහා හුරුකරවනු ලබන්නේ "උල් කටුව" අත තබමිනි. උල් කටුව භාවිතයෙන් ලිවීමේදී ඒ සඳහා පදම් කළ තල කොළ භාවිතයට නොගන්නා අතර පදම් නොකළ කොළය එනම් "කර කොළය" ලෙසින් ඉහත විස්තර කළ කොළය භාවිතයට ගනු ලබනවා. ඒවා අමු තල කොළ හෝ සකස් නොකරණ ලද තල කොළයි.

කළු මැදීම
පන්හිදෙන් ලියූ අකුරු හෙවත් කැපූ අකුරු කියවා ගැනීමට අවශ්‍ය වේ. එහිදී කැපූ අකුරු සඳහා පෙනීම ලබා දිය යුතුය. පන්හිදෙන් ලියූ විගස එය පත්ඉරුවෙහි දිස් වන්නේ කැපුමක් ලෙසට. එබැවින් මෙහි අකුරු මතු කර ගැනීම හෙවත් පැහැදිලිව මතුපිටට පෙනීම සඳහා ඒ මත ආලේපනයක් ගල්වා ගත යුතුයි. එම ක්‍රියාවලිය සඳහා භාවිතා වන නම වන්නේ "කළු මැදීම" ය. මේ සඳහා ලියන ලද තල කොළය මත විශේෂයෙන් සකස් කළ ආලේපනයක් හෙවත් ද්‍රාවණයක් ගල්වා ගනී. එය කළු මැදීම ලෙස ව්‍යවහාරයට පත්ව ඇත්තේ ඒ සඳහා අමුද්‍රව්‍ය

අනුසාරයෙන් සාදා ගන්නා තෙලය කළු පැහැති දාවනයක් වීම නිසාවෙන් ය. මෙම ආලේපනය නිවැරදි ප්‍රමිතියට සාදා ගනුවස් භාවිතා කරන අමුද්‍රව්‍ය අතර දුම්මල තෙල්, ගැඩුම අඟුරු, පුළුන් අඟුරු, දොරණ තෙල්, රන්තැඔිලි තෙල්, කැකුණ තෙල්, හා මල්, කැප්පෙටියා කොළ යනාදිය යොදා ගනිමින් මෙම දාවණය සාදා ගන්නා බව ලේඛනවල සඳහන්ය (ධම්මික හිමි, 2019 ; ධම්මානන්ද හිමි, 2019 ¦ De Silva, 1938*.

සුදු මැදීම

අනතුරුව සුදු මැදීම නම් කර්තව්‍යයක් ද සිදුකරනු ලබයි. මෙහිදී සිදුවන්නේ කළුමැදීමෙන් අනතුරුව ඉතිරි වූ අවශේෂ තෙල් තල කොළයෙන් ඉවත් කිරීම සඳහා කුරහන් පිටි හෝ දහයියා කුඩු හෝ ලී කුඩුවලින් මැදීමයි. එය "සුදු මැදීම" නම් වෙයි. (එඩ්වඩ්, 1996). මෙයින් ප්‍රස්කොළයට මනා නිමාවක් ලබාදෙමින් කළුමැද ඇති අකුරු හොඳින් පෙනෙන අතර අවශේෂ තෙල් ඉවත් කිරීම නිසාවෙන් තල කොළ එකිනෙක මත තබා ගනිමින් පොත බැඳ ගැනීමේදී අවහිරයක් නොමැති වේ. මෙසේ සුදු මැදීම නොකළහොත් කොළ එකිනෙකට ඇලීම සහ ඉක්මනින් ප්‍රස්කොළයක් පොත විනාශ වීම සිදුවිය හැකිය. එම ස්වභාවය මගහරවා ගනිමින් තල කොළ්‍යේ ඇති තෙල් ගතිය ඉවත්කොට භාවිතය සඳහා හොඳ නිමාවක් ලබා දෙයි.

කම්බා

යටෝක්ත පරිදි සාදාගත් ප්‍රස්කොළ පොත සඳහා කවර යෙදීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ දාරුමය කවර වන අතර සාමාන්‍ය වශයෙන් ගත් කළ ප්‍රස්කොළ ග්‍රන්ථය දිගින් වැඩි පළලින් අඩු ග්‍රන්ථ විශේෂයකි. එබැවින් ඒ සඳහා නොයෙක් අමුද්‍රව්‍ය භාවිතා කරමින් කවර නිෂ්පාදනය කරන අතර එම කවර සඳහා භාවිත වචනය වන්නේ "කම්බා" යනුයි. මෙම පොත් කම්බාවලට සිත්තර වැඩ, ලාකඩ වැඩ, කැටයම් වැඩ, හෝ කිසිවක් නොයෙදු ලී කවර සාදාගෙන ඇත. එයට අමතරව ඇත්දළ, රිදී, තඹ, පිත්තල, මෙන්ම සමහර අවස්ථාවන්හිදී විවිධ වටිනා දැව වර්ගයන්ද මේ සඳහා යොදාගෙන ඇති බව පෙනේ. වර්ණ භාවිතය ගත් විට ඒ සඳහා විවිධ වර්ණ යොදා ඇති බව කම්බා පරීක්ෂවේ දී පෙනී යන කරුණකි.

සකියා

සකියා යනුවෙන් හඳුන්වනු ලබන්නේ ප්‍රස්කොළ පොතේ කම්බයට පිටතින් නූලක ආධාරයෙන් රඳවන කුඩා විසිතුරු රඳවනයකි. මෙගින් තලකොළ එකිනෙකට ඇමිණූ නූල කම්බියට පිටතින් මතුකොට කම්බියෙන් නූල ගැලවී ප්‍රස්කොළ හෙවත් තලකොළ විසිරී යාම වැළැක්වීම සඳහා එක් පසෙක කම්බියට මතින් යෙදුවා වූ බොත්තමක් වැනි විසිතුරු භාණ්ඩයකි. මෙය විවිධ මාධ්‍යයෙන් මෙන්ම විවිධ හැඩවලින් සාදාගෙන ඇත. මේ සඳහා ලෝහ, රිදී, පිත්තල, පොල් කටු, ඉබිකටු, මැණික්, විවිධ පාෂාන, කඩදාසි, ඇත් දළ, ලෝකඩ, සත්ත්ව අං, කැස්බෑ ලෙලි, කාසි වර්ග, වීදුරු වර්ග, අර්ධ මැණික් යොදාගෙන ඇත.

හුය / පොත් ලණුව

මෙම නූල තනාගැනීම සඳහා කපු නූල, නියඳ කෙඳි ආදිය යොදා ගනී. නූල වඩාත් අලංකාර කර ගැනීම සඳහා විවිධ වර්ණයෙන් මෙන්ම විවිධ පාට නූල් වර්ග එකට අඹරා කිසියම් රටාවකට එය වියාගනු ලබයි. මෙමගින් ප්‍රස්කොළ ග්‍රන්ථයට අලංකාරයක් වනවා මෙන්ම විවිධ වර්ගයේ කපු නූල් භාවිතා කිරීම මගින් වර්ණවත් වනවා මෙන්ම වඩාත් අගයක් ද එකතු වෙයි. එපමණක් ද නොව, පොත හොඳින් බැඳ තබා ගැනීම මගින් එහි තුළට සතුන් ඇතුළුවීමට නොහැකි වන අතර කොළ විසිරී යාමද මෙයින් වළකාගත හැකිය. මෙයට ''පොත් ලණුව'' කියාද කියනු ලැබේ (ධම්මරතන හිමි, 2019 ; De Silva, 1947*. මෙම නූල හෙවත් හුය මගින් දෙපැති කම්බාවන් සහ පත්ඉරු සියල්ල ද එමෙන්ම සකියා ද සම්බන්ධ කර ගනිමින් ප්‍රස්කොළ පොත බැඳ තබා ගැනීම මගින් එහි බාහිර නිමාව අංග සම්පූර්ණවීමට හේතු කාරණාවක් වේ. මේ සඳහා නිල්, රතු සහ සුදට හුරු නූල් පොටවල් හතරක් යොදා අඹරා එක් නූලක් සාදා ගනී. (Nell, 1954)

දණ්ඩාසනය

මෙම භාණ්ඩය භාවිතා කරනු ලබන්නේ මේසයක් ලෙසය. එනම් පොත් කට්ටුව හෙවත් පොත් කොටස තබාගෙන ලීම සඳහා යොදා ගන්නා කුඩා මේසයකි. තවදුරටත් හඳුන්වතොත් ප්‍රස්කොළ පොතේ ලිවීම සඳහාම භාවිතා කරන කුඩා මේසයක් වශයෙන් හඳුනාගන්නා අතර එයට භාවිතා කෙරෙන පදය වූ කලී ''දණ්ඩාසනය''නම්. මෙය බුරු ඇඳක ආකාරයෙන් කුඩා ලී පතුරු ආදිය භාවිතයෙන් ද සාදාගන්නා අතර එය පොත් රඳවනයකි (එඩ්වඩ්, 1996).

බණ්ඩස්නය

ඉහත පැවසූ ලෙස ලියූ ප්‍රස්කොළ පොත හෝ පොත් තැන්පත් කොට දණ්ඩාසනය වසා තබන රෙදි කැබැල්ල හඳුන්වනු ලබන්නේ ''බණ්ඩස්නය'' නමිනි. කපු නූලෙන් වියා ගත් රෙදි කැබැල්ලකි.

පොත් ලේන්සුව

පුස්කොළ පොත් ගබඩා කිරීමේ දී එය ආරක්ෂා සහිතව නිසි පරිදි ගබඩා කර තැබීම සඳහා කිසියම් රෙදි කඩක් භාවිතා කරයි. මෙය බොහෝ විට ඒ ඒ පුස්කොළ පොත සඳහා වෙන වෙනම සාදන ලද රෙදි කඩක් වශයෙන් ද නියමිත වී ඇත. ඒ අනුව මෙම ලේන්සුව බොහෝ විට කපු රෙදිවලින් නිමකළ අතර එහි එක් කොනකින් හෙවත් මුල්ලකින් දිග කපු තුලක් ද ගැටගසා ඇත මෙය ද බොහෝවිට මෙම රෙදිවලින් ම තනාගත පටියකි. මෙසේ භාවිතා කරන රෙදි කැබැල්ල හඳුන්වනු ලබන්නේ "පොත් ලේන්සුව" ලෙසයි (එඩ්මන්ඩ්, 1996). මෙය කහ සහ රතු මෙන්ම සමහර අවස්ථාවලදී වෙනත් ලා පැහැති වර්ණයන් භාවිතයෙන් ද සාදා ඇත. මෙය හතරැස් ලොකු ලේන්සුවක් වන අතර අලංකාර ලෙස හැඩතල යොදා මුද්‍රිත හා වර්ණවත් ලෙස සකසා ඇත. එම හතරැස් රෙදි කැබැල්ලෙහි පුස්කොළ ග්‍රන්ථය ඔතාගනු ලබන්නේ ත්‍රිකෝණාකාර මුල් ඇතුලට නවා වැසී යන ආකාරයටය. අවසන අගිස්සට අමුණා ඇති රෙදි පටියෙන් පුස්කොළ පොත බැඳ ගනු ලබයි.

පොත් පසුබිම්

තවද පුස්කොළ පොත් නිෂ්පාදන කර්මාන්තයේ දී භාවිත වන සුවිශේෂී ව්‍යවහාරයක් ලෙස ''පොත් පසුබිම්'' හෙවත් ''පොත් පයි'' දැක්විය හැකිය. මෙය දිගටියට වියන ලද කොට්ට උරයක් වැනි පසුම්බියෙකි. මෙයද එක්තරා ලෙසකට පොත් තැන්පත් කර ගැනීම සඳහා භාවිතයට ගෙන ඇත. ඇතැම්විට මේවා කිතුල් වැනි දැව විශේෂයක් භාවිතයෙන් ද තනාගෙන ඇති අතර පන්කොළවලින් වියන ලද පොත් පසුම්බිද දැකිය හැකි වේ (එඩ්මන්ඩ්, 1996).

පෙට්ටගම

බොහෝ පුරාණයේ සිටි හික්ෂුන් වහන්සේලා මෙන්ම පුස්කොළ පොත් ආශ්‍රයෙන් ඉගෙනීමේ කටයුතුවල නියැලුණු අයවලුන් විසින් මෙම පුස්කොළ පොත් පුද්ගලික සන්තකයේ හෝ පොත්ගුල්හි තබාගෙන සිට ඇති බව පෙනේ. ඒ හැර මෙම පුස්කොළ ග්‍රන්ථවල වටිනාකම අනුව හෙවත් වැඩිදුර ආරක්ෂාව සඳහා පොත් ලේන්සුවල ඔතා ''පෙට්ටගම්වල'' වඩාත් ආරක්ෂාව තහවුරු වන පරිද්දෙන් මේවා තැන්පත් කරගෙන ඇත. බොහෝ සෙයින් මහනුවර යුගයේ පංසල්වල හා පිරිවෙන්හි මෙම පෙට්ටගම් භාවිතය දැකිය හැක (පියදාස, 1995). අද ද මේවා දැකිය හැකි ස්ථාන ලෙස කුරුණෑගල රිදී විහාරයේත්, දඹුල්ල විහාරයේත් තබා ඇති පෙට්ටගම්වල බහා තබා තැන්පත් කර ඇති ආකාරය දැකිය හැකිය.

එසේම පුස්කොළ ග්‍රන්ථ ගබඩාකරණයේදී වියළි පරිසරයක, පැතලි අතට තැන්පත් කර තබන්නේ නම් මෙම පුස්කොළ පොත් බොහෝ ආරක්ෂා වන බව පැවසේ (සේනාධීර, 1992). එහෙයින්ම මෙම පෙට්ටගම් සාදා ගැනීම සඳහා බොහෝ විට භාවිතා කර ඇත්තේ වටිනා ලී වන අතර එහි බහා ලීමෙන් අනවශ්‍ය හෙවත් අතිරික්ත ජල වාෂ්ප ලීවලට උරා ගැනීමත් ඒමගින් ඒවා පිටතට වාෂ්පවීමත් සිදු වේ. ඇතුලත තද සීතලක් හට නොගනී. එමෙන්ම ඒවා තද රස්සේ කාලවලදී පෙට්ටගම් තුළ ආරක්ෂාකාරිව තැන්පත් වේ. මෙම පෙට්ටගම් තුළ වාතයේ සංසරණය නොවන පරිදි තනා ඇති අතර ඒවා ඉතාම වර්ණවත් ලෙස අලංකාර කරගෙන ඇත. ඒ සඳහා සායම් මෙන්ම මැණික් ගල් එබවූ පෙට්ටගම් ද දැකිය හැකි වේ (පියදාස, 1965).

සමාලෝචනය

මෙම ලිපිය මගින් සාකච්ඡාවට බදුන් වූයේ පුස්කොළ ලේඛන නිර්මාණය හා බැඳි පාරිභාෂික ශබ්ද මාලාව පිළිබඳව යම් අර්ථ පූර්ණයක් ඉදිරිපත් කිරීමයි. ඒ අනුව ගත් කළ පුස්කොළ පොත් නිෂ්පාදනය එනම් තල ගස තේරීමේ සිට ග්‍රන්ථය ලියා අවසාන වූ පසු ගබඩාකරණය දක්වා වූ ක්‍රියාවලිය තුළ භාවිත වූ විවිධ වචන හා පද මෙන්ම ව්‍යවහාරයන් කුමන අර්ථයෙන් එම ක්‍රියාවලිය හා බැඳි පැවතියාද යන්න සෙවීමට උත්සාහ දැරීමයි. මෙහිදී විග්‍රහයට ලක් වූ කාරණය සම්බන්ධයෙන් බලන විට ලාංකේය පුස්කොළ පොත් කර්මාන්තය සතුව ඒ හා සම්බන්ධයෙන් බැඳි පැවතියා වූ ඉතා සාර පූර්ණ හා අර්ථවත් මෙන්ම සියොල්ම ආවේණික වදන් මාලාවක් මෙන්ම ව්‍යවහාරයක් පවතින බවත් ඒ කිසිදු භාෂාත්මක යෙදුමක් පුස්කොළ පොත් කර්මාන්තයෙන් වියුක්තව භාවිතා නොකෙරෙන බවත් හඳුනා ගැනීමට හැකි විය.

මෙතෙක් අප සාකච්ඡා කළ සාම්ප්‍රදායික භාෂාත්මක යෙදුම් පිළිබඳව අවධානය යොමු කළ විට එහි භාවිත සමහර ව්‍යවහාරයන් බුදු දහමේ පැනෙන හරයන් හා සමග වඩාත් සමීප සබඳතාවක් මෙන්ම එයින් නිපන් අර්ථයක් දෙන බව වැටහේ. නිදසුනක් වශයෙන් ගත් විට ''පොත් වහන්සේ'' ''දණ්ඩාසනය'' ''බණ්ඩස්නය'' යනාදිය බුදු දහමේ යෙදෙන ශබ්දාර්ථයන් බවත් අවබෝධයට ලක්වන බව පසක් වේ (එඩ්මන්ඩ්, 1996).

එනමුදු සමහර මෙහි එන ශබ්ද ගත් විට එම කර්මාන්තයට හා එයටම භාවිත වන වචන මාලාවක් පවතින බවට සාධක හමුවේ. ඒ අතර විශේෂත්වයක් සලකා බැලුවහොත් ''පොත් ගෙඩිය'' ''කම්බා'' ''පන්හිද'' ''උල්කටුව'' ''පත් කට්ටුව'' යනාදී භාෂාමය ව්‍යවහාරයෙන් මේ බවට නිදසුන් ලෙසට පෙන්වා දිය හැකිවේ.

ලංකා ඉතිහාසයේ ලේඛනය කර්තව්‍යයන් දෙස විග්‍රහාත්මකව විමසා බැලීමේදී මෙම පුස්කොළ ලේඛන නිෂ්පාදන කලාව වූ කලී ඉතා කෙටි කලක්, එමෙන්ම අඩු ශ්‍රමයක් වැය කරමින් හෝ අවම සහභාගිත්වයකින් නිම කළ හැකි කාර්යයක් නොවන බව ඉතිහාසය පුරාවට ලියැවී ඇති පුස්කොළ ග්‍රන්ථ ප්‍රමාණය හා විවිධ විෂයයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත්කම සලකා බලන විට පෙනීයන කරුණකි. එබැවින් මෙය ලංකාව තුළ මෙතෙක් ලේඛක ව්‍යාපාරය සම්බන්ධයෙන් පැවතියා වූ අති විශාල ලේඛන ප්‍රත්‍යුත්පාදන ක්‍රියාවලියක් වශයෙන් හඳුනාගත හැකි ව්‍යාපාරයක් වේ. එවැනි කටයුත්තක් සමාජය තුළත් ස්ථාපනය වූ ආකාරයත්, ඒ සඳහා අනුග්‍රහය ලැබී ඇති ආකාරයත්, එමෙන්ම සාම්ප්‍රදායික සමාජය තුළ වාචිකව පවත්වාගෙන එනු ලැබූ ධර්මයේ සංස්කෘතිකමය අගයන් මතු පරපුරට දායාද කිරීමට ගත් එකම හා ප්‍රථම උත්සාහයක් සම්බන්ධයෙන් සාකච්ඡා කළ විට මෙය එකම සුවිශාල කර්මාන්තයක්ව පැවති බවට තවත් සාක්ෂි වුවමනා නොවේ. එහෙයින්ම එය ලක් සමාජය තුළ ඉතා සාර්ථකව මෙන්ම අතිශය වැදගත්, ඉහළ පිළිගැනීමකින් ස්ථාවරත්වයට පත්ව ඇති ලේඛනය කර්මාන්තයක් වශයෙන් හඳුන්වා දිය හැකිය. මේ හෙයින්ම එක්තරා අන්දමකට මෙය ලේඛන කලාවක් වශයෙන් ද, එසේම ලේඛන නිෂ්පාදන ව්‍යාපාරයක් වශයෙන් ද, සමාජය තුළත් ලාංකික අධ්‍යාපනය තුළත් ස්ථාවරත්වයකට පත්වීම හේතුවෙන් රටම ආවේණික වූ ලේඛන සම්ප්‍රදායක්, හා ලේඛන රීතීන් ද, ලේඛන ආශ්‍රයයන් ද, එමෙන්ම ආවේණික භාෂා ව්‍යවහාරයන්ද, පාරිභාෂික යෙදුම් ද, ස්ථාපිත වී ඇති බව ප්‍රත්‍යක්ෂයෙන් වටහා ගැනීමට මෙය කදිම නිදසක් ලෙස පෙන්වා දිය හැකිය.

මෙසේ අත්‍යන්තයෙන් දියුණුවට පත්ව ඇති මෙම ලේඛන නිෂ්පාදන ක්‍රියාවලිය කොතරම් දුරකට ස්ථාවරව පැවතියාද යන්න, ඒ සඳහාම උරුම වූ භාෂා හා වදන් නිපදවී තිබීමෙන් පසක් කර ගත හැකිය. එහෙයින්ම මෙම ව්‍යාපාරය සම්බන්ධයෙන් වර්තමානය වන විටත් අධ්‍යයනයට ලක් කිරීමට තරම් වූ සාධක හා අරමුණු තිබෙන බවත්, ඒවාහි අන්තර්ගතය කෙසේ වුව ද ඒ හා සම්බන්ධ පරිවාර කාරණයන් සම්බන්ධයෙන් සලකා බලන විට පෙනේ. එබැවින් නොයෙක් ක්ෂේත්‍රයන් අළලා නොයෙක් පර්යේෂකයන්, කලාකරුවන්, හා ශාස්ත්‍රීය විද්වතුන්, වියත් පඬිවරුන් මෙන්ම මෙම ක්ෂේත්‍රයෙහි ගැඹුර හා පරතෙර දත් බහුශ්‍රැතයන් විසින් විසි එක්වන සියවස දක්වාම තවදුරටත් මෙහි නොයෙක් ඉසව් සම්බන්ධයෙන් කතිකාවට බඳුන් වන්නේ, පර්යේෂණයෙහි හා විමර්ශනයෙහි මෙන්ම විග්‍රහයෙහි යෙදෙන්නන්, එම ක්‍රියාවලිය තුළ දක්නට ලැබෙන සාර්ථකත්වය හා එය අනෙකුත් ලේඛන කර්මාන්තයන්ට වඩා වෙනස් වූ නිසාවෙන්ය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අභුබුදු, අරීසෙන් (2000), *අරුත නිරුත*, 84 පි.

ඇල්ලේපොල, දීපාංජනී (2007). *තල්පත් ලිවීම : පුස්කොළ ලේඛන සම්පාදනය සහ සම්ප්‍රදාය පිළිබඳ අත්පොතක්*, කොළඹ : මධ්‍යම සංස්කෘතික අරමුදල

එඩ්මන්ඩ්, කේ. බී. ඒ. (1996). *පුස්කොළ පොත් ලේඛන කලාව පිළිබඳ සම්මන්ත්‍රණය*, කොළඹ : ජාතික කෞතුකාගාර පුස්තකාලය, 1-11 පි.

කුලසූරිය, ආනන්ද (1996). *පුස්කොළ පොත් හා ලේඛණ කලාව, සංස්කෘතික පුරාණය*, 2 වෙළුම, 1 කලාපය, 35 -37 පි.

ධම්මරතන හිමි, කහටගස්දිගිලියේ (2019). ශ්‍රී ලාංකේය පුස්කොළ පොත් නිර්මාණකරණය සඳහා භාවිත සාම්ප්‍රදායික තාක්ෂණික ක්‍රියාවලිය පිළිබඳ හැඳින්වීමක්. *ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය* 2019-1, සංස්: බලන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි, ගොමිල ගුණාලංකාර හිමි සහ බී. වෙනුර ලක්ෂ්මන්, අනුරාධපුර : ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, 35-48 පි.

ධම්මික හිමි, පහලගම (2019). පුස්කොළ අධ්‍යනයේ භාවිතා පාරිභාෂික ශබ්ද, *ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය* 2019-1, සංස්: බලන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි, ගොමිල ගුණාලංකාර හිමි සහ බී. වෙනුර ලක්ෂ්මන්, අනුරාධපුර : ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, 11-21 පි.

පරණවිතාන, කේ. ඩී. (1996). ශ්‍රී ලංකාවේ පුස්කොළ ලේඛනවල ආරම්භය සහ විකාශනය, *කෞතුකාගාර 6 කලාපය*, කොළඹ : ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, 20-26 පි.

රත්නායක, ආර්. එම්. රෝහන (2019). *ලේඛනයේ ආරම්භය සහ පුස්කොළ පොත ලේඛන කලාව පිළිබඳ විමසුමක්*, 1-10පි.

ලගමුව, ආරිය (2006). *ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාව*, බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

සේනාධීර, ආරියරත්න (1992). පුස්කොළ ලේඛන සංරක්ෂණය, *ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ කලා සඟරාව*, 43 කලාපය (දෙසැ) 7-9 පි.

සෝරත හිමි, වැලිවිට (2019). ලක්දිව පුස්කොළ ලේඛණ කලාවෙහි ආරම්භය හා විකාශය, *ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහය* 2019-1, සංස්: බලන්ගොඩ ආනන්ද චන්ද්‍රකීර්ති හිමි, ගොමිල ගුණාලංකාර හිමි සහ බී. වෙනුර ලක්ෂ්මන්, අනුරාධපුර : ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, 1-12

සෝරත හිමි, වැලිවිටියේ (1999). *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය*, කොළඹ : එස්. ගොඩගේ, 631 පි.

De Silva, C. M. Austin (1947). Sinhalese National Heritage in Ola leaf. *The Buddhist,* Vol. XVIII, No. 5, Colombo : YMBA. 27-78 P.

De Silva, C. M. Austin (1969). Production of books in ancient Ceylon, *In education in Ceylon from the sixth centry B.C. to the present day.* A centenary volume, Colombo : Minsitry of Edcuation adn Cultureal Affairs. 227- 233 P.

De Silva. W. A. (1938)' Catalogue of palm leaf manuscripts in the library of the Colombo Museum. Memoirs of the Colombo Museum's series A. No.Vol' II, Ceylon Government Press: Colombo.

Nell, Andreas (1932). Ceylon Palm leaf manuscript books, *Ceylon Observe, Annual*, 29 -32 p.

Nell, Andreas (1954). Palm-leaf Manuscrips or Ola books. *Ceylon Today*, Vol. 3 -4 (March – April), 35-40 P.

Piyadasa, T. G. (1985). Bibliographical Methods of Ancient Sri Lanka, *Libraries in Sri Lanka their origin and History from Ancient times to the present time*. India : Sri Satguru Publication.

GIRIMĀNANDA SUTTA AS AN AUDIO-VISUAL & BREATHING RELAXATION THERAPY FOR DRUG ADDICT COMMUNITY

C Abeywardana[1], AS Kaluarachchi[2] and K Hettigoda[3]

Abstract

Drug addiction among young people is a critical issue in both Eastern and Western countries in the 21st century. Addiction impacts not only the individuals using drugs or alcohol but also their families and society. The main objective of this study is to determine the therapeutic functions of the Buddhist ritual performance in promoting physical and mental health issues using human senses, specifically the effects of mindful listening to Buddhist Paritta (Girimānanda sutta) chanting with mindful breathing, called Ānāpānasati. The emerging researches are exploring low-cost and non-invasive interventions as a therapy for drug addiction relaxation. One such intervention is the recital of Paritta, which aims to protect living beings from disasters, pain, and fear. It is believed that reciting Paritta verses soothes the nerves and induces mental and physical balance through the six senses. The Girimānanda Sutta, which includes 'Dasa Saññā' and ends with the mindful breathing exercise called Ānāpānasati, is noteworthy. This study adopts mix method will be received ethical approval from the research council of the University of Kelaniya. The sample consisted of 150 individuals from rehabilitation camps in Gampaha, Matale (Raththota) and Anuradhapura (Galkiriyagama). Participants listened to low-frequency Paritta sounds (>70Hz) for 35 minutes while the meanings of the Paritta were displayed on screens. The box breathing relaxation technique was used in conjunction with Ānāpānasati. The study assesses mood changes in the subjects before the intervention, immediately after, three days after, and one week after exposure to the repetitive Paritta sounds, visuals, and mindful breathing technique. Anxiety and stress levels were measured. Mood improvement was assessed using a subjective pain assessment scale rated from 0 to 10, and a Mood Barometer in which drug addict communities rated their mood on a visual analogue scale. Results indicated significant mood improvement following the intervention. These findings suggest that Paritta blessing sounds, combined with visual and mindfulness breathing techniques, could serve as effective, non-invasive and low-cost therapies for drug addiction relaxation.

Keywords: Buddhist rituals, Mood improvement, Drug Addiction, Girimānanda sutta, Mindful breathing

[1] Faculty of Postgraduate Studies , University of Kelaniya, Sri Lanka

Email: chandana_abeywardana@yahoo.com   iD https://orcid.org/0009-0002-8561-8872

[2] Senior Lecturer, Department of Pali & Buddhist Studies, University of Kelaniya, Sri Lanka

Email: amilsk@kln.ac.lk   iD https://orcid.org/0009-0001-0890-8190

[3] Senior Lecturer, Department of Psychology, University of Peradeniya, Sri Lanka

Email: kanthihettigoda@gmail.com   iD https://orcid.org/0000-0002-2069-1545

Introduction

Drug addiction among young people is a critical issue in both Eastern and Western countries in the 21st century. Addiction impacts not only the individuals using drugs or alcohol but also their families and society. Box breathing is a powerful Western relaxation technique which focuses to return breathing to its usual rhythm after a stressful situation. It includes breathing in and out and holding the breath. Box breathing helps clear the mind, relax the body, unbeatable mind, reduction of anxiety, depression and stress. It can be used alongside other mindfulness exercises. The main objective of this study was to determine the therapeutic functions of the Buddhist ritual performance in promoting physical and mental health issues. The emerging researches are exploring low-cost and non-invasive interventions as a therapy for drug addiction relaxation. One such intervention is the recital of *Paritta*, which aims to protect living beings from disasters, pain, and fear. It is believed that reciting *Paritta* verses induces mental and physical balance through the human senses. The *Girimānanda sutta* contains *'Dasa saññā'* and ends up with mindful breathing, called *Ānāpānasati*. *Girimānanda Thera* cured after discoursing in virtue. This is an adopts mixed-method study. Ethical approval was taken by the research council of the University of Kelaniya. The sample consisted of 150 individuals from rehabilitation camps in Gampaha, Matale district (Raththota) and Anuradhapura (Galkiriyagama). They were facilitated to hear *Paritta* verses with Low frequency (>70Hz) for 35 minutes and the meanings of them were displayed on a screen simultaneously. The Box breathing relaxation technique was used in conjunction with *Ānāpānasati*. Subjects were assessed after exposing them to repetitive (*Girimānanda sutta*) *Paritta* sound and mindful breathing, called *Ānāpānasati* and repetitive vowel sounds in two sessions (before the intervention, immediately after, one week after). The mood was assessed using a subjective mood assessment scale which was rated 0-10. Mood Baro -meter in which drug addict communities were asked to rate their mood in a visual analogue was used to gauge the relaxation. Results showed that there was a improvement the mood after the intervention. These findings imply that the therapeutic functions of the Buddhist ritual performance in promoting physical and mental health issues using human senses, specifically the effects of mindfulness listening to Buddhist *Paritta (Girimānanda sutta)* blessing with mindful breathing, called *Ānāpānasati* could be utilized as an effective, non-invasive and low-cost relaxation therapeutic tool.

Contemporary Relevance

Sound is a form of energy that needs a medium for transmission through a space or to reach a point from the origin. The molecules of the medium oscillate as the sound transmits through it due to the energy transferred from one molecule to another. (Tanner, 2012). The oscillated molecules cause other molecules to oscillate, which produces sound as a consequence of vibration. When this stimulus is applied to the ears as sound waves, it 'drives' a brain response through the auditory system. (Hooper, 2001).

According to research on Neuroplasticity, one of the hottest topics in brain science, which refers to the brain's recently discovered ability to change its structure and function, alpha level under meditation or through external sound effects like FFR (frequency following response) (Punkanen & Aia-Rouna, 2012). Listening to *Paritta* chanting for periods longer than 10 minutes would bring the human brain into alpha stage - a trance level similar to meditation. As such, Buddhist *Paritta* chanting was produced a calming effect on mind and increase the body's immune system, it also produces lasting changes in the brain leading to increase the IQ level, learning abilities and problem-solving capabilities, sustained positive emotions, gives relief for insomnia, reshapes and expands the mind to foster happiness and cultivate compassion, thicken the brain tissues, increase attention and sensory processing, and increased oxytocin peptide will increase the well-being and sense of trust in social situations (Jayaratne, 2006).

Box breathing is a powerful Western relaxation technique which focuses to return breathing to its usual rhythm after a stressful situation. It includes breathing in and out and holding the breath. It can be used alongside other mindful exercises. It has physiological, psychological and emotional benefits (Samantha et al., 2023). The *Girimānanda sutta* contains mindful breathing, called *Ānāpānasati* (Ariyawansa, 2018).

Research Objectives:
The main objective of this study was to determine the therapeutic functions of the Buddhist ritual performance in promoting physical and mental health issues, specifically the effects of mindful listening to Buddhist *Paritta (Girimānanda sutta)* chanting with mindful breathing, called *Ānāpānasati.* The emerging researches are exploring low-cost and non-invasive interventions as therapies for drug addiction relaxation.

Literature review
Previous research provides valuable insights into the Buddhist philosophy of communication by exploring various aspects of mindfulness, emptiness, conflict resolution and relativity in Buddhism.

The *Paritta* can be concentrated upon by the Buddha and the arahants without the aid of another. However, when they are ill, it is easier for them to listen to what others recite, and thus focus their minds on the *Dhamma* contained in the *suttas,* rather than think of the *Dhamma* themselves. There are occasions, such as in the case of illness, which weaken the mind, where hetero-suggestion has been found to be more effective than auto-suggestion. "The belief in the effective power to heal, or protect, of the *saccakiriya,* or asseveration of something quite true, is but another aspect of the work ascribed to the *Paritta.*" (Sarada, 2012).

The listeners are blessed by the reciters with the words, - *etena saccavajjena sotthi te hotu sabbadā*, which means "by the power of the truth of these words may you ever be well", at the end of the recital of each *sutta*. The saying, "the power of the *Dhamma* or Truth protects the follower of the *Dhamma" (dhammo have rakkhati dhammcāriṃ)* indicates the principle behind these *sutta* recitals. The effect of *Paritta* can also transcend any distance, however great. Mental well-being is produced by *Paritta* recital in those who listen to them with intelligence and confidence in the truth of the Buddha's words (Ariyawansa, 2018).

The recital of *Paritta* can also bring material blessings through the wholesome states of mind induced by concentration and confidence in listening intelligently to the recital. According to the Buddha, right effort is a necessary factor in overcoming suffering. Listening to these recitals in the proper way can generate energy for securing worldly progress while also securing spiritual progress (Siri Rahula, 2016).

A Japanese study conducted by Masaru Emoto shows that water when exposed to *Paritta* sound for several hours and then freeze produced hexagonal shape ice crystals. Since our body is consisting of about 70% of water, when listen to the *Paritta,* many water molecules in our body become hexagonal aggregates (otherwise pentagonal or some other shape). It has been found that such hexagonal water is contained our body and its cells healthy and disease free (Ariyawansa, 2018).

When studying the previous research on the topic of "Buddhist on Communication", and "Effectiveness of listening to repetitive sound with mindfulness breathing on human brain" it is important to pay attention to the following research. It seems that all those studies have been done in different aspects of how language and communication should be in society or after stressful situation

The *Girimānanda Sutta* contains the *"Dasa Saññā"* and concludes with a mindfulness breathing exercise called *Anapanasati*. According to the written history in the *Aṅguttara Nikāya (Tipiṭaka)* and the book of protection, the Venerable *Girimānanda* was afflicted with a disease, suffering gravely from it. The Lord Buddha then taught the "Ten Contemplations" to the Venerable *Ananda* and instructed him to recite them to the Venerable *Girimānanda* for the sake of his sickness (Siri Rahula, 2016).

Monks or practitioners are instructed to go to a solitary place (a forest, at the foot of a tree or an empty house) to maintain concentration and structural balance (Ariyawansa, 2018). These contemplations are:

1. Contemplation of Impermanence: This involves reflecting on the transient nature of all phenomena. They then dwell on the contemplation of impermanence in the five aggregates. Visible objects, feelings or sensations, perceptions, formations, and consciousness are all considered impermanent (Sarada, 2012).

2. Contemplation of *Anatta* (Absence of a Permanent Self or Soul): Practitioners reflect on the non-self nature of all phenomena. The eye, visible objects, the ear, sounds, the nose, smells, the tongue, tastes, the body, bodily contacts, the mind, and mental objects are all understood to be not the self (Ariyawansa, 2018).

3. Contemplation of Foulness (*Asubha*): This involves contemplating the impurity of the human body. Practitioners reflect on 32 parts of the body as being full of impurities, considering elements such as hair, nails, teeth, skin, flesh, sinews, bones, organs, and various bodily fluids (Siri Rahula, 2016).

4. Contemplation of Disadvantage (Danger): This involves reflecting on the various diseases and afflictions that the body is subject to. Practitioners are to consciously memorize the disadvantages and dangers of sicknesses, such as eye-disease, ear-disease, nose-disease, tongue-disease, and many others (Piyadassi, 1999).

5. Contemplation of Abandonment: At this stage, practitioners work on dispelling unwholesome thoughts such as sensual desire, ill-will, and cruelty. They do not tolerate these thoughts and work to abandon, dispel, and annihilate them (Sarada, 2012).

6. Contemplation of Detachment: Practitioners reflect on the peace and sublimity of detachment, considering the stilling of all conditioned things, the giving up of all substratum of becoming, the extinction of craving, and the realization of Nibbana.

7. Contemplation of Cessation: This involves contemplating the cessation of all component things, the extinction of craving, and the realization of Nibbana.

8. Contemplation of Distaste for the Whole World: Practitioners reflect on abandoning concern and clinging to the world, giving up mental prejudices, wrong beliefs, and latent tendencies concerning the world (Sarada, 2012).

9. Contemplation of Impermanence of All Component Things: Practitioners contemplate the impermanence and transitory nature of all conditioned things, leading to a sense of detachment and disenchantment.

10. Mindfulness of In-Breathing and Out-Breathing *(Ānāpānasati)*: This involves a sequence of breathing exercises. Practitioners sit down in a solitary place with folded legs, keeping the body erect, and maintaining mindfulness. They practice recognizing long and short breaths, training in calming the breath, experiencing rapture and bliss, experiencing and calming mental formations, concentrating the mind, and contemplating impermanence, detachment, cessation, and abandonment (Piyadassi, 1999). According to the literature, when the Venerable *Girimānanda* heard these contemplations, his affliction was immediately cured, and he recovered from his sickness (Siri Rahula, 2016).

Relaxation techniques are therapeutic exercises indicated to assist patients in decreasing physical and psychological tension and anxiety. Box breathing is a breathing exercise to assist patients with stress management and can be implemented before, during and after stressful situations. Box breathing uses four simple steps. Its title is intended to help the patient visualize a box with four equal sides as they perform the exercise. The length of the steps can be adjusted to accommodate the individual (e.g., 2 seconds instead of 4 seconds for each step). Guided imagery is a relaxation exercise intended to assist patients with visualizing a calming environment. Visualization of tranquil settings assists patients with managing stress via distraction from intrusive thoughts. Cognitive behavioral theory suggests that emotions are derived from thoughts, therefore, if intrusive thoughts can be managed, the emotional consequence is more manageable (Samantha et al., 2023).

When researched Under meditative trance or listening to *Paritta* chants consciously, into repetition of *Paritta* blessing sound with mindful breathing that causes reduction of stress level, relaxation, pain relief, attain well-being and mindfulness in participants most, it seems that the *Paritta* in their own religion has shown the most beneficial (Ariyawansa, 2018).

This is research conducted through adopts mix research methods and primary and secondary sources have been used for data collection. Also, by using the data source to provide the data related to the research, it has been tried to achieve the objectives of the research by analyzing the data.

Methodology
This study adopts mix method to reach its objectives. Drug addicted individuals were the study population and the sample consisted of 150 individuals from rehabilitation camps in Gampaha, Matale (Raththota) and Anuradhapura (Galkiriyagama). Ethical approval was obtained from the research council of the University of Kelaniya. participants listened to low-frequency *Paritta* sounds (>70Hz) for 35 minutes while the meanings of the *Paritta* were displayed on screens. The Box breathing relaxation technique was used in conjunction with *Ānāpānasati*. The study assesses mood changes in the subjects before the intervention, immediately after and one week after exposure to the repetitive *Paritta* sounds, visuals, and mindful breathing technique. Relaxation and mood improvement were assessed using a subjective assessment scale rated from 0 to 10, and a Mood Barometer in which patients rated their mood on a visual analogue scale.

Results & Discussions

Test was done using a Mood Barometer and a visual analogue scale (0 to 10) in which patients rated their mood on. Pretest was done before intervention. 1st posttest was done immediately after audio-visual exposure to the *Girimānanda sutta* which contains *'Dasa saññā'*, includes mindful breathing, called *Ānāpānasati*.


Figure 01: audiovisual and mindful breathing sense balance in the Buddhist ritual

Results showed that there was a significant mood improvement after the intervention in 35 minutes duration. 2nd posttest was done in one week after continuing of audio-visual exposure to the *Girimānanda sutta* which contains mindful breathing, called *Ānāpānasati*.


